

සෞගන්ධශෛලාභිධාන ශ්‍රීවර්ධනපුර

# මල්වතු මහාවිහාරය



# සෙංඛණ්ඩශෛලාභිධාන ශ්‍රීවර්ධනපුර

# මල්වතු මහාවිහාරය



මල්වතු මහාවිහාරවාසී
හෙම්මාතගම පියදස්සි හිමි
*BA Hons History, MPhil, PhD Reading (Kelaniya)*

මල්වතු මහාවිහාරය
මහනුවර

2024

**සෞංඛණ්ඩශෛලාභිධාන ශ්‍රීවර්ධනපුර මල්වතු මහාවිහාරය**

හෙම්මාතගම පියදස්සි හිමි

ප්‍රථම මුද්‍රණය : 2024 ජූලි

ISBN : 978-624-5554-07-2

**ඡායාරූප :**

වීනස් ස්ටුඩියෝ
මහනුවර
දුරකතන අංකය : 077 785 4710

**පරිගණක අක්ෂර සංයෝජනය හා පිටු සැලසුම :**

හසිත චාමිකර ගුණසිංහ


**කංචුක නිර්මාණය හා මුද්‍රණය :**

විද්‍යාලංකාර මුද්‍රණාලය
පෑලියගොඩ
දුරකතන අංකය : 011 291 1382

**ප්‍රකාශනය :**

මල්වතු මහාවිහාරය
මහනුවර
දුරකතන අංකය : 081 222 4066





## සයාමොපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේගේ ආශීර්වාදය



සෙංඛණ්ඩශෛලාභිධාන ශ්‍රීවර්ධනපුර උපොසථ පුෂ්පාරාම විහාරද්වයෙන් ප්‍රතිමණ්ඩිත මල්වතු මහාවිහාරය, මිහිඳු මහරහතන් වහන්සේ විසින් ප්‍රතිෂ්ඨිත ථෙරවාදී මහාවිහාර ශාසන ප්‍රවේණියට අන්තර්ගත උභය මහාවිහාර අතර ප්‍රමුඛතම සංඝ ප්‍රවේණියයි. මල්වතු, අස්ගිරි උභය මහාවිහාර, මහාවිහාර පරම්පරානුගත ග්‍රාමවාසී, අරඤ්ඤවාසී උභයවාසයෙන් පැවත එන බව විද්වත් මතයයි.

මේ අතරින් මල්වතු මහාවිහාරය පෞරාණික සංඝ පරම්පරා ඇතුළත් වන, වර්තමාන ශාසන පුනරුදයේ ආදිකර්තෘභූත වැලිවිට පිණ්ඩපාතික අසරණ සරණ සරණංකර සංඝරාජයන් වහන්සේගේ නිත්‍ය වාසස්ථානයයි. එපමණක් නොව මීට ඇතුළත් පෝයමළු විහාරය උභය මහාවිහාර සංඝයාටම වැදගත් වන්නකි. සයාමොපසම්පදාවට පෙර දෙවරක් සිදු කරන ලද රක්ඛංග උපසම්පදාව සඳහා වැඩම කළ රක්ඛංග භික්ෂූන්ටත්, සයාමොපසම්පදාවේදී ප්‍රවර උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රධාන මහතෙරුන් වහන්සේලාටත් සෙනසුන් පිළියෙල කර දී ඇත්තේ

පුෂ්පාරාම විහාර පරිශ්‍රයේ ය. උභය විහාරීය සංඝයා උපසම්පදා ලැබීම, සඟරජ පදවිය හා දෙවෙහෙර මහපදවි පත් කිරීම සහ කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත සම්පාදනය කිරීම වැනි වත්මන් ශාසන පුනරුදයට අදාළ සියලු කාර්යය සිදුව ඇත්තේ ද මෙහිදීය.

එපමණක් නොව තිබ්බටුවාවේ, දරම්ටිපොල, ගිනිගත්පිටියේ, රඹුක්වැල්ලේ හා මොරතොට යනාදී සඟරජ මාහිමියන්ගේ ශිෂ්‍ය යතිවරයන් වහන්සේලා වෙතින් සුවිසල් ධර්ම ශාස්ත්‍රීය මෙහෙවරක් ඉටුව ඇති අතර දක්ෂිණ ලංකාවට ද එහි ආලෝකය පැතිර ගිය අයුරු වේහැල්ලේ හා මුල්කිරිගල ආදී සංඝ පරම්පරා විමර්ශනයෙන් පැහැදිලි වේ. එමෙන්ම අටමස්ථානය, ශ්‍රීපාදස්ථානය ආදී දෙදහස් සාරසියයකට වැඩි සම්භාවනීය පූජ්‍යස්ථාන මල්වතු මහාවිහාර පාර්ශ්වයට අන්තර්ගතව තිබීම ද සැලකිය යුත්තකි.

මේ ආදී වශයෙන් අතිසම්භාවිත වූ මල්වතු මහාවිහාරයේ ඓතිහාසිකත්වය සංක්ෂිප්තව මෙම පුස්තිකාවෙන් ඉදිරිපත් වී තිබේ. මෙම වටිනා පුස්තිකාව සම්පාදනය කළ අපේ මල්වතු මහාවිහාරවාසී හෙම්මාතගම පියදස්සි නමට මෙවැනි ධර්ම ශාස්ත්‍රීය කටයුතුවල තවදුරටත් නිරත වීමට ශ්‍රී දංෂ්ට්‍රාධාතුන් වහන්සේගේ ආශීර්වාදය ලැබේවායි ආශිංසනය කරම්හ.



මහනුවර උපොෂිත පුෂ්පාරාම විහාරද්වයාධිපති

**තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන**

මහාවිහාරවංශික ස්‍යාමොපාලි මහානිකායේ

මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහානායක ස්ථවිරයන් වහන්සේ

# පූර්විකාව

පන්සාළිස් වසක් මුළුල්ලේ බුදුන් වහන්සේ වදාළ නිර්මල ධර්මය හා එහි පැවැත්ම පිණිස පනවා වදාළ විනය සහිත බුද්ධ භාෂිතය උන්වහන්සේගේ නියම පරිදි සම්බුද්ධ පරිනිර්වාණයෙන් අනතුරුව මහරහතන් වහන්සේලා විසින් තුන්විටක් සංගායනා කරන ලදී. ස්ථවිරවාද, ථෙරවාද නම් ලද ධර්ම විවරණ සහිත තත් ශාසන ප්‍රවේණිය රාජකීය අනුග්‍රහයෙන් මහා මහින්ද මහරහතන් වහන්සේ විසින් මෙරට පිහිටුවා වදාළහ. අනුරාධපුර මහමෙවුනාවේ ප්‍රතිෂ්ඨිත මෙය 'මහාවිහාරය' යන නම් ලද්දේ ය. කල්‍යත්ම එය හුදෙක් විහාර නාමයක් පමණක් නොව ආචරියවාද, අනන්‍ය සම්ප්‍රදායක් සහිත සංඝ ප්‍රවේණියක් බවට පත්විය.

අරිට්ඨ මහතෙරුන් ප්‍රමුඛ හෙළදීපවාසීන් පැවිදිව විනය ඉගෙන විනය සංගායනා කිරීම, ශ්‍රී මහා බෝධියේ ශාඛා, ධාතු චෛත්‍ය පිහිටුවීම, හෙළබසින් ධර්ම විවරණ භාණක පරම්පරාවෙන් ආරක්ෂා කිරීම, ඒකීය ස්වෛරී රාජ්‍යයක් සඳහා පාලකයන්ට මගපෙන්වීම, අභයගිරි ජේතවන නිකායාන්තර හමුවේ පවා නොසැලී කටයුතු කිරීම, දුර්දශාපන්න අවස්ථාවන්හිදී රජුන් ආරක්ෂා කිරීම හා පාලන බලයේ පිහිටුවීම, ත්‍රිපිටකය අටුවා ග්‍රන්ථාරූඪ කිරීම, ජාත්‍යන්තර ව්‍යාප්තිය පිණිස පාලි භාෂාවට පරිවර්තනය කිරීම සඳහා අවකාශය සැලසීම, ජාතියේ හා

ශාසනයේ ඉතිහාසය ලියා තැබීම, මහාපරාක්‍රමබාහු රජතුමාගේ අනුග්‍රහයෙන් නිකායත්‍රය සමගිකොට මහාවිහාර සම්ප්‍රදාය නැවත ඉදිරියට ගැනීම, පොළොන්නරු යුගයේ සිට ග්‍රාමවාසී, අරඤ්ඤවාසී සම්ප්‍රදාය දෙකක් ලෙස සංඝරාජයන් වහන්සේ නමකගේ නායකත්වයෙන් කටයුතු කිරීම, ධර්ම ශාස්ත්‍ර භාෂා ශාස්ත්‍ර නැංවීමෙහිලා ග්‍රන්ථකරණය හා පිරිවෙන් පැවැත්වීම, ශාසනශුද්ධි වරින්වර ඇති කිරීම සහ කතිකාවත් සම්පාදනය කිරීම, සියම, බුරුමය යන රාජ්‍යවල උපසම්පදාව පිහිටුවීම, බටහිර ආක්‍රමණ හමුවේ රට ජාතිය හා සසුන බේරාගැනීමට ක්‍රියා කිරීම, දළදා වහන්සේ වෙනුවෙන් නොකඩවා පුද සිරිත් පැවැත්වීම, ශාසනික පදවි ධානාන්තර පත් කිරීම, විහාරාරාම නිරවුල්ව පැවැත්වීම, සංඝයා සම්බන්ධ අධිකරණ විනිශ්චය, උපසම්පදා විනය කර්ම සහිත ශාසනික විනයකර්ම පැවැත්වීම සහ ජාතික අර්බුදවලදී තීරණාත්මක ලෙස මැදිහත් වීම යනාදී වශයෙන් ඉතිහාසය තුළ තීරණාත්මකව කටයුතු කරන ලද මහාවිහාරයේ ප්‍රමුඛතම සංඝ ප්‍රවේණිය මල්වතු මහාවිහාර පාර්ශ්වයයි. එහි ඉතිහාසය සංග්‍රහ කිරීම අතිශය භාරධූර කාර්යයකි.

**උපොසථ පුෂ්පාරාම විහාරද්වයාධිපති අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගලාභිධාන මහාවිහාරවංශික ස්‍යාමොපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේගේ** නියමයෙන් අප විසින් සම්පාදිත මෙම පුස්තිකාව ඒ සඳහා ගත් අල්පමාත්‍ර උත්සහයකි. මෙය විවේචනාත්මකව විචාරීමෙන් මල්වතු මහාවිහාරය පිළිබඳ ප්‍රශස්ථ ඉතිහාසයක් සංග්‍රහ කළ හැකිය යන්න අපගේ අදහසයි. මල්වතු මහාවිහාරයේ ඉතිහාසය සංක්ෂිප්තයෙන් හෝ

දැනගැනීමට කෘතියක් නොමැති තත්ත්වයක් හමුවේ මේ සඳහා අපව මෙහෙයවා, ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කළ අපේ ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේ පාදාභිවන්දනයෙන් යුතුව මෙහිලා සිහිපත් කර සිටිමි.

මෙම කාර්යය සඳහා අවවාද අනුශාසනා ලබාදුන් මල්වතු මහාවිහාරයේ සානුනායක ගරුතර කාරක මහාසංඝ සභාවේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ද, පැරණි ලේඛන සපයාදුන් පිටිසර විහාරයන්හි ස්වාමීන්ද්‍රයන් වහන්සේලා ද, හරවත් අදහස් ඉදිරිපත් කරමින් ඉතා සැලකිල්ලෙන් පුස්තිකාවේ පරිගණක අක්ෂර සංයෝජනය සිදු කළ කැලණිය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය හසිත චාමිකර ගුණසිංහ මහතා සහ විද්‍යාලංකාර මුද්‍රණාලය කෘතවේදීව සිහිපත් කර සිටිමි. තොරතුරු ලබාදුන් සුධීමතුන්ට ද කෘතවේදී වෙමි.

හෙම්මාතගම පියදස්සි හිමි

070 559 5633 | hemmathagamapiyadassi@gmail.com


ශ්‍රී බුද්ධ වර්ෂයෙන් 2568ක් වූ ඇසළ මස 11 වන ගුරුදා ය.

තරිඳු රැසින් දිසි හරගිර මෙන් නිත්ත
සුරිඳු බිතින් පහ සුනු පිරියම් යුත්ත
මෙපුරසරින් නැඟි පියුමක සිරි ලත්ත
වෙහෙර බලන් මහසඟ විසු මල්වත්ත

මෙම රන් අයුරු රන්ගැබ උරමත ලකු ලූ
මනරම් කැලුම් රැඳි හරකිරුළ සිරිසි ලූ
ගනරන් කොතින් සැදි පහවට මලු බැබ ලූ
සුපසන් වෙහෙර සිරි බල සකි පොහොයමලූ

**කිරල සන්දේශය**





සෙංඛණ්ඩශෛලාභිධාන ශ්‍රීවර්ධනපුර

# මල්වතු මහාවිහාරය

මහනුවර පෞරාණික රාජධානියේ අඛණ්ඩව අවිච්ඡින්නව වර්තමානය දක්වා සජීවීව ක්‍රියාත්මක වන ආයතන ත්‍රිත්වයකි. එනම් ශ්‍රී දංෂ්ට්‍රාධාතු මන්දිරය, මල්වතු මහාවිහාරය සහ අස්ගිරි මහාවිහාරයයි. මෙමගින් විමර්ශනයට ලක්වන්නේ මල්වතු මහාවිහාරයේ ඓතිහාසිකත්වය පිළිබඳවයි. 'මල්වතු මහාවිහාරය' යනුවෙන් මෙහිලා හඳුන්වනු ලබන්නේ උපොසථාරාමය සහ පුෂ්පාරාමය යන විහාරද්වයෙන් යුතු, පුෂ්පාරාම මහාවිහාරයේ මංගල උපොසථාගාරය කේන්ද්‍ර කරගත් පාලන සංවිධානයට අයත් වෙහෙර විහාර පිරිවෙන් ආවාස ගොඩමඩ ඉඩකඩම් ආදියත්, ඒ හා බැඳුණු භික්ෂු සංඝයාත්, උන්වහන්සේලා විසින් ප්‍රවේණිගතව පවත්වාගෙන එනු ලබන්නා වූ වත්පිළිවෙත්, චාරිත්‍රධර්ම ආදී සියල්ලත් ය. එකී පාලන සංවිධානය ශ්‍රීමත් මහානායක මාහිමිපාණන් වහන්සේ වරප්‍රමුඛ සානුනායක ගරුතර කාරක මහාසංඝ සභාවක් මගින් මෙහෙය වේ.

වර්තමානය වන විට උපසම්පදාව පදනම් කරගෙන නිකායත්‍රයක් ලක්දිව ක්‍රියාත්මක වේ. ඒ අතරින් ස්‍යාම නිකාය ප්‍රමුඛත්වයට

පත්ව ඇත්තේ එය මෙරට අවසන් වරට රාජකීය අනුග්‍රහය ඇතිව මනා සංවිධාන සැලැස්මකින් සමාරබ්ධ වීමත්, ඊට මෙරට පෞරාණික සංඝ පරම්පරා ඇතුළත් වීමත්, මතු නොව මෙරට සම්භාවනීය වෙහෙර විහාරස්ථාන තත් සංඝයාගේ පාලනයට නතුව තිබීමත් නිසා ය. ස්‍යාම නිකාය ප්‍රධාන පාර්ශ්ව දෙකකින් සමන්විත වේ. එනම් මල්වතු සහ අස්ගිරි යනුවෙනි. මෙකී දෙවෙහෙර ස්වාධීන පාලන සංවිධානයකින් සහ ඊට ආවේණික ලක්ෂණවලින් සමන්විත වන අතර අත්‍යන්තයෙන්ම අන්‍යොන්‍යව බැඳී සිටී.

ආරණ්‍යවාසී, ග්‍රාමවාසී සම්ප්‍රදායන් විදර්ශනා ධුර, ග්‍රන්ථ ධුර වශයෙන් බුදුන් ධරමාන සමයේ පටන් පැවතිය ද, යථොක්ත උභය මහාවිහාරයන්හි සමාරම්භය යටත් පිරිසෙන් පොළොන්නරුවේ මහාපරාක්‍රමබාහු රජතුමාගේ (1153-1186) ශාසන සාමග්‍රීය සහිත කතිකාවතෙන් අනතුරුව සංවිධානය වී යැයි සිතීමට කරුණු තිබේ. එනම් මහාවිහාර, අභයගිරි හා ජේතවන නිකාය භේදය සංසිඳුවීමෙන් අනතුරුව ග්‍රාමවාසය සහ අරඤ්ඤවාසය යන උභයවාසය ද, ඊට මහතෙර පදවි දෙකක් සහ දෙවාසයට අධිපති මාහිමි (සංඝරාජ) පදවිය ආරම්භ වීමෙනි.[1] ඒ අනුව මල්වතු මහාවිහාර පාර්ශ්වය වනාහි ග්‍රාමවාසීන්ගෙන් පැවත එන සඟ පරපුර බවත්, අස්ගිරි මහාවිහාර පාර්ශ්වය යනු අරඤ්ඤවාසීන්ගෙන් පැවත එන සඟ පරපුර බවත් මේ වන විට පිළිගත් මතයයි.

[1]. ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ (1995), ***පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්,*** පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය, 115-118 පිටු

මහනුවර යුගය ආරම්භයත් සමග පෝයමළු විහාරය සහ අස්ගිරි විහාරය යනුවෙන් ස්ථාපිත වූ යථොක්ත උභය පාර්ශ්වය එකම මහාවිහාර භික්ෂු පරපුරක් බව ඉතිහාසය විමර්ශනයේදී පැහැදිලි වේ. මෙම දෙපාර්ශ්වය මිශ්‍ර වූ අවස්ථා, එක්ව විහාර පිළිගත් ආකාරය සහ එකම විහාරය තුළ සාමග්‍රියෙන් වැඩසිටි ආකාරය ***රාජරත්නාකරය*** ආදී සාහිත්‍ය මූලාශ්‍රය සහ ලංකාතිලක පර්වත ලිපිය ආදී ශිලාලේඛනගත මූලාශ්‍රය මගින් ද තහවුරු වේ.[2]

මෙහිදී විමර්ශනයට බඳුන්වන 'මල්වතු මහාවිහාරය' එනමින් ස්ථාපිත වනුයේ කන්ද උඩරට කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේදී (1747-1782) ය. එසේ වුව ද, ඊට අයත් භික්ෂු සමූහයාගේ පරම්පරා කථාව ඊට වඩා දුරාතීතයකට දිවෙයි. එකී ඉතිහාසය ස්වාධීනව ගොඩනැගීමට මල්වතු පාර්ශ්වීය සංඝයා උත්සුක වූ බවක් නොපෙනේ. ඊට හේතුව තමන්වහන්සේලා මහාවිහාර සඟ පරපුරේ ප්‍රධාන ධාරාව බවත්, නූතන භික්ෂු සංඝයා පුෂ්පාරාම විහාරයේ මංගල උපොසථාගාරයේදී සිදු කරන ලද ස්‍යාමොපසම්පදාවත් සමග බිහි වූ බවත් විශ්වාස කිරීම බව පෙනේ. එමෙන්ම මල්වතු මහාවිහාර පාර්ශ්වය වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේ සහ ස්‍යාමොපසම්පදාව මහත්කොට සැලකූ බව පෙනේ.

ස්වකීය ආචාර්ය ප්‍රාචාර්යන් වහන්සේලා විසින් පවත්වාගෙන එන ලද සම්ප්‍රදාය කඩ නොකොට පැවැත්වීමත්, පවත්නා රජයට

---

2. ***රාජරත්නාකරය*** (1995), රූපසිංහ, කරුණාදාස (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 132-135 පිටු; Paranavitana, S. (1960), 'Lankatilaka Inscriptions,' ***University of Ceylon Review*** 18, nos. 1&2, University of Ceylon, Colombo, pp. 04-06

අනුකූලව ව්‍යවස්ථානුකූලව ස්වාධීන කාර්යයේ යෙදීමත් මල්වතු මහාවිහාර පාර්ශ්වයේ කැපී පෙනෙන ලක්ෂණ අතර වේ.

මෙරට ඉතිහාසය තුළ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ කාර්යභාරය කැපී පෙනේ. යටත්විජිත සමය, ජාතික නිදහස් සටන සහ මෑත ඉතිහාසය තුළ දේශපාලන, සමාජ හා ආර්ථික කටයුතුවලට මල්වතු මහාවිහාරය මැදිහත් වූ ආකාරය අවධානය යොමුවිය යුතු කරුණු ය. මල්වතු මහාවිහාරයේ භූමිකාව අතීතයටත් වඩා වර්තමානය වන විට පුළුල් වී ඇති බව පෙනීයන්නේ රට තුළ කවර ගැටලුවක් පැන නැඟුණ ද, මල්වතු මහාවිහාරයේ මතය කුමක්දැයි දැනගැනීමට මහජනතාව උත්සුක වීමෙනි.

ශාසනික කටයුතු විෂයෙහි පමණක් නොව මේ වන විට දේශපාලන, සමාජ, ආර්ථික ක්ෂේත්‍ර කෙරෙහි ද මල්වතු මහාවිහාරය වැදගත් වී තිබේ. ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ යන බලත්‍රිත්වය තුළ ව්‍යාකූලතා ඇති වූ අවස්ථාවලදී ඒවායේ යථා පැවැත්ම වෙනුවෙන් මල්වතු මහාවිහාරය මැදිහත් වූ අවස්ථා බොහෝ ය. එබැවින් මල්වතු මහාවිහාරය සතු ඓතිහාසික බලප්‍රවාහය ද, ඒ පිළිබඳ පොදු මහජනතාව තුළ පවත්නා විශ්වාසය ද තීරණාත්මක අවස්ථාවලදී වඩාත් තීව්‍ර බව පෙනීයයි.

එබැවින් ඓතිහාසිකව පැවත එන බලප්‍රවාහයක් සහිත එමෙන්ම වර්තමානයේ ද පොදු ජනතාවගේ විශ්වාසයට පාත්‍රව ඇති මල්වතු මහාවිහාරයේ සමාරම්භය සහ ඓතිහාසිකත්වය සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම මෙම පුස්තිකාවේ පරමාර්ථයයි.

## උපොසථාරාමය හෙවත් පෝයමළු විහාරය



උපොසථාරාමයේ බාහිර පෙනුම

පොහොයමළුව, උපොසථාරාමය යනාදී නම්වලින් ප්‍රකට 'පෝයමළු විහාරය' මල්වතු මහාවිහාරයේ ඓතිහාසික විකාශනයේ සංලක්ෂයක් වශයෙන් පෙන්වාදීමට පිළිවන. ඊට හේතුව ගම්පොළ රාජධානි සමයෙන් පසුව උභයවාසී මහාසංඝයා ඒකරාශී වූ මූලස්ථානයක් වශයෙන් පෝයමළු විහාරය හඳුනාගැනීමයි. මල්වතු මහාවිහාරයේ ත්‍රිවිධ චෛත්‍යස්ථානය ද, ධර්ම ශාස්ත්‍රෝද්ග්‍රහණය කෙරෙන සංඝරාජ පිරිවෙන ද මෙම භූමියේ පිහිටා තිබේ.

පෝයමළු විහාරයේ ඉතිහාසය ***රාජරත්නාකරය, මහාවංසය*** සහ ***සූළුරාජාවලිය*** යනාදී මූලාශ්‍රය වාර්තා කරයි. මෙහි සමාරම්භය සෙංකඩගල නුවර ආරම්භය හා බැඳී පවත්නා හෙයින්

විවාදාපන්න තත්ත්වයක පවතී. ගම්පොළ තුන්වන වික්‍රමබාහු රජතුමා (1357-1374) විසින් සෙංකඩගලපුරය ආරම්භ කළ බවත්, සේනාසම්මත වික්‍රමබාහු රජතුමා (1479-1511) විසින් එකී පුරවරය උඩරට රාජධානියේ අගනුවර බවට පත්කරගන්නා ලද බවත් සාමාන්‍ය අදහසයි.[3]

කෙසේ වෙතත් ***රාජරත්නාකරය*** සහ ***මහාවංසය*** පැහැදිලිව වාර්තා කර ඇති පරිදි උපොසථාරාම විහාර කර්මාන්තය කරවා ඇත්තේ බුද්ධ වර්ෂ 2085 හෙවත් ව්‍යවහාර වර්ෂ 1541 වැන්නෙහි වීරවික්‍රම නමැති රජතුමා විසිනි.[4] ඒ රජතුමාගේ විහාර කර්මාන්ත කාලය වන විටත් සෙංකඩගල නුවර උභයවාසී සංඝයාට නිවාසස්ථානයක්ව පැවති අතර උපොසථාරාම භූමිය ද එවැන්නක් වන්නට ඇත.

ඒ අනුව ශාසනික කටයුතු සඳහා වීරවික්‍රම රජතුමා මූලිකස්ථානයේ තබාගෙන ඇත්තේ 'දසදික්හි පතළ තෙජො කීර්ති ශ්‍රී ඇති ධර්මකීර්ති මහාස්ථවිරයන් වහන්සේ' ය. මෙමගින් දඹදෙණි රාජධානි සමයේ සිට පැවත එන ධර්මකීර්ති සඟ පරපුර හා පෝයමළු විහාරය අතර පැවති සබැඳියාව තහවුරු වන අතර උන්වහන්සේගේ නිවාසස්ථානය වී ඇත්තේ ගඩලාදෙණියේ සද්ධර්මතිලක විහාරයයි.[5] ***රාජරත්නාකරය*** 'ධර්මකීර්ති

---

3. සෙනෙවිරත්න, අනුරාධ (1989), ***කන්ද උඩරට මහනුවර***, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ, 15 පිටුව

4. හෙට්ටිආරච්චි, ඒ.ඇස්. (1968), 'මහනුවර රජපරපුර', ***Journal of Royal Asiatic Society*** Vol. XII New Series, Royal Asiatic Society Colombo Branch, Colombo, pp. 123-129

5. සරණංකර හිමි, වැලිවිට (2022), ***ශ්‍රී සද්ධර්මතිලක රජමහා විහාර ඉතිහාසය***, සංඝරාජාරාමය, මල්වතු මහාවිහාරය, මහනුවර, 10 පිටුව

මහාස්ථවිරයන් ගෙන්වා' යනුවෙන් වාර්තා කිරීමෙන් පෙනීයන්නේ සෙංකඩගලපුර උපොසථාරාමයට උන්වහන්සේ වැඩමවාගත් බවයි. එහිදී රජතුමා උභයවාසයේ කාරක මහාසංඝයා ද වැඩම කරවා ශාසනශුද්ධියක් කොට මහවැලි ගඟෙහි කරවන ලද උදකුක්ඛේප සීමාවෙහි තුන්සිය පනස්පස් නමක් උපසම්පදා කර වූ බව ***රාජරත්නාකරය*** වාර්තා කරයි.[6]

'...තව ද පන්තිස් නමක් පිරිවරකොට පරදෙසින් වැඩි ත්‍රිපිටකධාරී මහාස්ථවිර කෙනෙකුන් වහන්සේට අභිනව මහාවිහාරයක්.... පිළිගන්වා උභයවාසගත සියගණන් මහාසංඝයා පිටකත්‍ර පාළි ධර්මය අස්වා බොහෝ ශාසනොපකාර කරවා...' ආදී වශයෙන් වාර්තාකොට ඇති පරිදි උපොසථාරාම විහාරය ආශ්‍රිතව රජතුමා විදේශයෙන් වැඩමකළ භික්ෂූන්ට පවා ආරාම කරවා දී තිබේ.[7] ඒ අනුව පසුව රාජකීය පුෂ්පොද්‍යානය වී පුෂ්පාරාමය බවට පත් වූ භූමිය තුළ පවා ආරාම විසිරී පවතින්නට ඇත.

මෙනිසා උපොසථාරාමවාසීන්ගේ ධර්මශාලාව වූ **චිත්‍රකූට මණ්ඩපය**[8] වත්මන් මල්වතු මහාවිහාරයේ පොහොය සීමාව පිහිටි ස්ථානය වශයෙන් සැලකේ. මේ ආදී වශයෙන් උපොසථාරාමය ක්‍රමයෙන් මහාවිහාර පරම්පරානුගත උභයවාසී සංඝයාගේ මූලස්ථානය බවට පත්ව තිබේ.

---

[6]. ***රාජරත්නාකරය*** (1995), 138-139 පිටු

[7]. එම, 137 පිටුව

[8]. එම, 136 පිටුව '...මෙසේ නොයෙක් විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් විචිත්‍ර වූ චිත්‍රකූටගෙය පවිත්‍රකොට සරහා වියන් බඳවා මහාර්ඝ වූ ධර්මාසනයක් පණවා...'

## මහාවංසයේ එන තොරතුරු



උපොසථාරාමයේ පෙතිපිළිම

වීරවික්‍රම රජතුමාගේ උපොසථාරාම විහාර කර්මාන්තය පිළිබඳ ***මහාවංසයේ*** සඳහන් වන්නේ පහත පරිද්දෙනි;

තස්මිං වසන්තො සො රාජා - චතුසංගහ වත්ථුහි
ජනරඤ්ජෙත්‍වා සද්ධාය - පුඤ්ඤ කම්මං සමාරභි

අත්තනො රාජගෙහස්මා - නාතිදූරෙ මනොරමෙ
භූමිභාගෙ මුනින්දස්ස - ධාතු වඩ්ඩෙත්‍වා සොභනං
චෙතියඤ්චාපි කාරෙත්‍වා - තදාසන්නෙ ද්විභූමිකං

උපොසථ මාලකඤ්ච - ඉට්ඨිජදනාදිකෙ
ඡාසීති සංඝආවාසෙ - නගරස්ස සමන්තතො

කාරාපෙත්වා තත්ථ තත්ථ - වාසාපෙත්වා භික්ඛවො

පතිට්ඨ හිත්වා සද්ධම්මං - අස්සොසි ජින දෙසිතං[9]

...ශ්‍රී සංඝබෝධි මහරජාණන්ගේ ගෝත්‍රයෙහි උපන්නා වූ වීරවික්‍රම නම් වූ කුමාරයෙක් තෙම සර්වඥයන් වහන්සේගේ පිරිනිවීමෙන් දෙදහස් අසූපහක් ගෙවුන කල්හි මහාබලැතියේ මහවැලි ගඟ නැමැති අගලින් අලංකෘත වූ සෙංකඩගල සිරිවර්ධන නම් පුරයෙහි රජවිය. එකල එහි වසන්නා වූ ඒ රජතෙම සිවුසඟරාවතින් ජනයන් රඤ්ජනය කොට ශ්‍රද්ධාවෙන් පින්කම් කරන්නට ආරම්භ කෙළේ ය.

තමන්ගේ රජගෙයින් ඉතා දුරු නුවූ සිත්කළු වූ භූමිභාගයෙක්හි මුනීන්ද්‍රයන් වහන්සේගේ (පාත්‍රා) ධාතු වඩා හේ තෙමේ චෛත්‍යයක් ද, ඒ සමීපයෙහි උළුසෙවිලි ආදියෙන් යුක්ත වූ දෙමහල් **පොහෝමළුවක්** ද, අසූසයක් වූ සංඝාවාසයන් ද කරවා ඒ ඒ තන්හි භික්ෂූන් වස්වා උපස්ථානකොට බුද්ධදේශිත වූ සද්ධර්මය ඇසුයේ ය. හේ තෙමේ උදාර වූ පූජාකොට පස්පණසක් පමණ සර්වරාත්‍රියෙහි කියන්නා වූ ධර්මයන් ද ඇසුයේ ය....[10]

---

[9]. ***ඵනපූරණ සහිතො මහාවංසො*** (1959), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 90 පරි. 08-11 ගාථා

[10]. ***මහාවංසය*** ද්විතීය භාගය (2015), සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, දොන් අන්ද්‍රියස් ද සිල්වා (පරි.), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ, 92 පරි. 06-13 ගාථා

මේ අනුව වීරවික්‍රම රජතුමා උපොසථාරාමය රාජකීය මහාවිහාරයක් වශයෙන් ප්‍රතිෂ්ඨාපනය කරන ලද බවත්, එහි මුනීන්ද්‍රයන් වහන්සේගේ ධාතූන් වහන්සේලා තැන්පත් කොට ස්තූපයක් කර වූ බවත් ඉහත ***මහාවංසගත*** විස්තරයට අනුව පෙනීයයි. සංඝාරාම අසූහයක් යනු විශාල ආරාම සංකීර්ණයකි.

කෙසේ වෙතත් කිරිමුහුද (මහනුවර වැව) කරවීම ආදී නොයෙක් පාරිසරික සහ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වර්තමානය වන විට උපොසථාරාම පරිශ්‍රය විශාල වෙනසකට ලක්ව තිබේ. එසේ වුව ද ප්‍රතිමාගෘහය සහිත උපොසථාරාමයේ වාස්තුවිද්‍යාත්මක හා කලාත්මක ලක්ෂණ විමර්ශනයෙන් එහි පෞරාණිකත්වය හොඳින් වටහාගත හැකිය.

**රාජරත්නාකරයේ එන තොරතුරු**

***රාජරත්නාකරය*** රචනා කරනු ලබන්නේ වල්ගම්පාය අභයරාජ පිරිවෙන් තෙරසාමීන් විසිනි. සමකාලීන තොරතුරු වාර්තා කිරීම හේතුවෙන් මෙම අධ්‍යයනයේදී ***රාජරත්නාකරය*** වැදගත් මූලාශ්‍රයක් බවට පත් වේ. එහිලා වීරවික්‍රම රජතුමා රාජත්වයට පත් කටුපුළුබද සෙංඛණ්ඩශෛලාභිධාන ශ්‍රීවර්ධනපුරය පිළිබඳ විසිතුරු වර්ණනාවක් ඉදිරිපත් වේ. එහි පවත්නා අතිශයෝක්ති අලංකාරාදිය දුරහැර බලන විට මෙම රජතුමා නගරයකට අවැසි බොහෝ නගරාංගවලින් සෙංකඩගල නුවර සමන්විත කර වූ බව පෙනීයයි.

> ...ප්‍රසිද්ධ ප්‍රශස්ත ප්‍රවර ක්‍ෂත්‍රිය වංශොද්භූත වූ මේ රජතෙමේ නානා දේශවාසී නිඛිල ජන ප්‍රාර්ථනීය වූ සකල

නගරාංග සම්පත්තීන් යුක්ත වූ ජන්ම ප්‍රවේණි වූ ඒකභූමික ද්විභූමික ත්‍රිභූමිකාදී ප්‍රභේද ඇති නානා ප්‍රකාර විචිත්‍ර චිත්‍ර කර්මාන්ත විශේෂයෙන් යුක්ත භිත්ති සෝපානමාලාවෙන් සමලංකෘත වූ සුධාධවල කෛලාසකූට ප්‍රතිභාග ප්‍රාසාද පන්තීන් හා එසේම සුරක්ෂිත වූ නොයෙක් ප්‍රාකාර පන්තීන් හා නානා ප්‍රකාර චෛත්‍යාංගන බෝධ්‍යාංගන ප්‍රතිමාගෘහ වීථි වින්‍යාස සර්ව සම්පත්තීන් සමෘද්ධි සම්පන්න වූ කටුපුළුබැද සෙණ්ඛණ්ඩ නම් වූ ශ්‍රීවර්ධන පුරවරයෙහි රජ පැමිණ... තමන් වසන පුරප්‍රවරාසන්නයේ බුදුන්ගේ ශාරීරික ධාතු පිහිටුවා අපමණ ධන පරිත්‍යාග කිරීමෙන් මහවෙහෙරක් කරවා තදාසන්නයෙහි ශිලාස්ථම්භ හිඳුවා විචිත්‍ර චිත්‍ර කර්මාන්තයෙන් යුක්ත ද්විභූමික උපොසථමාලයක් ද නොයෙක් ධන පරිත්‍යාගයෙන් කරවන ලද ප්‍රතිමාගෘහයක් ද එහිම සතරදිගින් වඩින මහාසංඝයාට සාංඝික කොට කරවන ලද විචිත්‍ර චිත්‍ර කර්මාන්ත සුධාධවල භිත්ති ස්ථම්භ සෝපානමාලාවෙන් විරාජමාන වූ ඉෂ්ටකාච්ඡදන සංඝාරාමයක් ඇතුළු වූ සයාසූවක් සංඝාරාම කරවා සුප්‍රතිපන්න ඍජුභාවාදී රක්ෂිත පෝෂිත ශීලස්කන්ධයන් ඇති උභය වාසගත මහාසංඝයා වහන්සේට පිළිගන්වා එහි වැඩහිඳිනා ස්ථවිර නවක මධ්‍යමාදී මහාසංඝයා වහන්සේට චීවරාදී සිවුපස දානයෙන් උපස්ථාන කරන්නේ....[11]

[11]. ***රාජරත්නාකරය*** (1995), 132-135 පිටු



ඉංග්‍රීසි ජාතික සී.එච්. කැමරන් වර්ෂ 1870දී සිතුවමට නැගූ උපොසථාරාමය

පෝයමළු විහාරයේ සමාරම්භය පිළිබඳ ***අස්ගිරි තල්පත*** සහ ***පෝයමළු උපත*** යන ලේඛන ද තොරතුරු වාර්තා කරයි. එසේ වුව ද එම මූලාශ්‍රය වාර්තා කරන තොරතුරු ප්‍රධාන ධාරාවේ මූලාශ්‍රයට වඩා වෙනස් ස්වරූපයක් ගන්නා බව නිරීක්ෂණය කළ හැකිය. ගම්පොළ සමයේදී රචනා වන නිකාය සංග්‍රහ කතුවරයා 'උභයවාසය අඛණ්ඩව පැවැත්ත මැනවැයි සිතා', 'උභයවාසයේ සංඝයාට මහදන් පවත්වා' සහ 'උභයවාසයේ සංඝයා රැස් කරවා' යනාදී වශයෙන් වාර්තා කර ඇති ආකාරයෙන් උභයවාසය තත් සමයේ ක්‍රියාත්මක වූ ආකාරය අවබෝධ කරගත හැකිය.[12]

[12]. ***නිකාය සංග්‍රහය*** (2001), නානායක්කාර, ගුණවර්ධන (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 45 පිටුව

එබැවින් උභයවාසයේ සංඝයාට පොහොයමළුව පිළිගැන්වීය යන අදහස වඩාත් සාධිකාරී ය.

කෙසේ වෙතත් කල්යත්ම උද්ගත වූ නොයෙක් හේතු නිසා පෝයමළු විහාරය ග්‍රාමවාසීන්ගේ සංඝ මූලස්ථානය ලෙසත්, අස්ගිරි විහාරය අරණ්‍යවාසීන්ගේ සංඝ මූලස්ථානය ලෙසත් සංවිධානය වූ බව පෙනේ. එසේ වුව ද උභයවාසයෙන් විකාශනය වූ උභය මහාවිහාර එකිනෙකට ස්වාධීන මෙන්ම අන්‍යොන්‍ය වශයෙන් අත්‍යන්තයෙන්ම බැඳුණු පාර්ශ්ව දෙකක් වශයෙන් හඳුනාගැනීම නිවැරදි ය.

## පෝයමළු විහාරානුබද්ධ පෞරාණික සංඝ පරම්පරා

මහාවිහාර ශාසන පරම්පරානුගත ඉපැරණි සංඝ පරම්පරා රාශියකට සම්බන්ධ භික්ෂූන් පෝයමළු විහාරයේ වැඩසිටි බව මූලාශ්‍රය ගණනාවකින් අනාවරණය වේ. ඒ අතර කෝට්ටේ යුගයේ සිට පැවත එන බුවනෙකබා මහතෙරුන්ගේ සඟ පරපුර, ගඩලාදෙණිය ශ්‍රී සද්ධර්මතිලක රජමහ විහාරයට සම්බන්ධ ධර්මකීර්ති සඟ පරපුර සහ සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහ විහාරයට සම්බන්ධ කිත්සිරිමෙවන් රාජසුන්දර සඟ පරපුර යනාදිය මල්වතු මහාවිහාරීය සංඝ පරම්පරාවේ අසම්භින්නතාව හෙළිකරන පෞරාණික සංඝ පරම්පරා වේ.

මෙකී පෞරාණික සංඝ පරම්පරා අභිනව ශාසනවංශයක් බිහිකළා වූ වැලිවිට අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන්ගේ නොමද සම්භාවනාවට පාත්‍ර වී තිබේ. පෝයමළු විහාරයේ නායක පදවිය හෙබවූ වටපුළුවේ මාහිමියන්ගෙන් ***බාලවතාරේ*** උගත්

ලෙවුකේ රාලහාමි සහ පල්කුඹුරේ අත්ථදස්සි සාමණේරයන්ගෙන් උන්වහන්සේ ශාස්ත්‍රෝද්ග්‍රහණය කළ බව ***සංඝරාජ සාධු චරියාවේ*** සඳහන් වේ. එබැවින් නොයෙක් හේතු නිසා උපසම්පදාවෙන් පිරිහී ගිය නමුත් පෝයමළු විහාරයේ ප්‍රතිබලසම්පන්න භික්ෂූන් වැඩසිටි බව පෙනේ. වැලිවිට සරණංකර සාමණේරයන්ගේ පැවිදි ආචාර්යන් වහන්සේ වන්නේ ද පෞරාණික කිත්සිරිමෙවන් රාජසුන්දර සඟ පරපුරට අයත් සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර තෙරුන් වහන්සේ ය.[13]

## ගඩලාදෙණියේ ධර්මකීර්ති සඟ පරපුර

උඩනුවර ගඩලාදෙණිය ශ්‍රී සද්ධර්මතිලක රජමහ විහාරයට සම්බන්ධ ධර්මකීර්ති සඟ පරපුර මල්වතු මහාවිහාරය හා බැඳුණු පෞරාණික සංඝ පරම්පරාවකි.[14] එය වනාහි වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ ධර්ම ශාස්ත්‍රීය පුනරුදයට මූලාධාර වූ අධ්‍යාපනික කේන්ද්‍රස්ථානයක් වශයෙන් ද හඳුන්වාදිය හැකිය. භික්ෂු වාසයෙන් තොර වූ මෙම විහාරය වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා (1707-1739) වැලිවිට සරණංකර සංඝරාජ මාහිමි වෙත පවරා තිබේ.[15]

---

[13]. ***සංඝරාජ සාධු චරියාව*** (1997), විමලවංස හිමි, අකුරටියේ සහ සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස, සමයවර්ධන ප්‍රකාශකයෝ, කොළඹ, 03-04 පිටු

[14]. ***මල්වතු මහාවිහාර වංශය*** (1989), විමලබුද්ධි හිමි, වල්ගොව්වාගොඩ සහ තවත් අය (සංස්.), බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, 06 පිටුව

[15]. සරණංකර හිමි (2022), 11 පිටුව

ධර්මකීර්ති පරපුර පිළිබඳ නොයෙක් අදහස් ඇතත් පැහැදිලිව පෙනීයන පරිදි එහි සමාරම්භය සිදුව ඇත්තේ දඹදෙණියේ දෙවන පරාක්‍රමබාහු රාජ්‍ය සමයේ (1236-1270) තමලිංගමුවෙන් වැඩම කළා වූ ධර්මකීර්ති මහතෙරුන් වහන්සේගෙනි.[16] දෙවන පරාක්‍රමබාහු රජතුමා ඒ වන විටත් පැවති ග්‍රාමවාසී වනවාසී උභයවාසයට අතිරේකව භික්ෂූන් තුළ ප්‍රතිපත්ති පූරණය අපේක්ෂාවෙන් පලාබත්ගල අරඤ්ඤායතනය ආරම්භකොට ඇති අතර එහි නායකත්වයට පත්කොට ඇත්තේ යථොක්ත ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ ය. මෙම අභිනව ආයතනය දෙවාසයේම සම්මිශ්‍රණයක් ලෙස ආරම්භ වීම සුවිශේෂී වේ. භික්ෂූන් වහන්සේලා තුළ ප්‍රතිපත්ති දියුණු කිරීම සහ විදර්ශනා ධුරය ප්‍රගුණ කරවීම මෙහි මූලික අපේක්ෂාව විය.[17]

කෙසේ වෙතත් මෙමගින් අරඤ්ඤවාසය වඩාත් ජනප්‍රිය වූ අතර ධර්මකීර්ති පරපුර අරඤ්ඤවාසයට නැඹුරු පරපුරක් ලෙස විකාශනය වී තිබේ. මෙහි ආරම්භක ස්ථානය වන පලාබත්ගල අරඤ්ඤායතනය වර්තමානයේ ද මල්වතු මහාවිහාර පාර්ශ්වයට අයත් නාරම්මල, රුක්මලේ ගිරිගුහාරාම පුරාණ විහාරය වශයෙන් හඳුනාගත හැකිය.

---

[16]. රෝහණදීර, මැන්දිස් (2016), ***ලංකාවේ සංඝ සංවිධානය***, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 119 පිටුව

[17]. ***පූජාවලිය*** (2009), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 791 පිටුව

මූලාශ්‍රයේ දැක්වෙන පරිදි ධර්මකීර්ති පරපුරේ ප්‍රකට යතිවරු මෙසේ ය.[18]

අනුරාධපුර මහාවිහාර සංඝයාගේ
අසම්භින්නත්වය අත්නොහළ
පලාබත්ගල ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ
(තමලිංගමුවේ ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ)
↓
වෛශ්‍යවංශික පලාබත්ගල ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ
↓
ගඩලාදෙණිය රජමහ විහාරයේ සමාරම්භක
සීලවංශ ධර්මකීර්ති හෙවත්
පළමුවන ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ
↓
මහාදැළියාමාන ශ්‍රී දේවරක්ෂිත ජයබාහු
ද්විතීය ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ
↓
කෝට්ටේ යුගයේ විසූ ධම්මදින්නාචාර්ය විමලකීර්ති
තෘතීය ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ
↓
චතුර්ථ ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ

[18]. ***සද්ධර්මාලංකාරය*** (1996), ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ සංස්කරණය, කොළඹ, 731-733 පිටු ***සද්ධර්මරත්නාකරය*** (1955), දේවානන්ද හිමි, ධර්මකීර්ති ශ්‍රී සුගුණසාර (සංස්.), රත්නාකර ප්‍රකාශන, කොළඹ, 532-533 පිටු

ඉහතින් සඳහන් කළ පරිදි වීරවික්‍රම රජතුමාගේ ශාසනික කටයුතු සඳහා මූලාධාර වී ඇත්තේ ද චතුර්ථ ධර්මකීර්ති මහතෙරුන් වහන්සේ බව පෙනේ. වර්තමානයේ ද 'ධර්මකීර්ති' යන අභිධානය මල්වතු මහාවිහාර පාර්ශ්වය විසින් ගරු සම්භාවනීය අභිධානයක් වශයෙන් සම්භාවිත ය.

## සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර සඟ පරපුර

සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහ විහාරය මුල්කරගත් සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර සඟ පරපුර යනු වර්තමාන ශාසනවංශය මල්වතු මහාවිහාරය කේන්ද්‍ර කරගනිමින් ප්‍රතිෂ්ඨාපනය කළා වූ වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ ආචාර්ය ප්‍රාචාර්ය පරපුරයි.

ඓතිහාසික කාලානුක්‍රමිකතාව පදනම් කරගනිමින් තත් සඟ පරපුර සංග්‍රහ කර තිබෙන ඉපැරණි ලේඛනයක් විහාරය සන්තකව පවතී. මෙම ලේඛනය සම්පාදිත කාලවකවානුව නිශ්චිතව සඳහන් නොවන නමුත් දඹදෙණි රාජධානි සමයේ පටන් කන්ද උඩරට ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය සමය (1798-1815) දක්වා විහාරයේ වැඩසිටි සම්භාවනීය යතිවරයන් වහන්සේලා පිළිබඳ එමගින් දත හැකිය. ශ්‍රී වික්‍රම රාජසිංහ රාජ්‍ය සමය දක්වා මෙහි සඟ පරපුර දක්වා ඇති හෙයින් ඒ සමයේ හෝ ඊට පසුව මෙය සංග්‍රහ කරන්නට ඇති අතර ඊට පූර්වයෙන් වැඩසිටි ස්ථවිර පරම්පරාව දැක්වීමේදී කතුවරයා විසින් මුඛ පරම්පරාගත ප්‍රවෘත්ති මෙන්ම විහාර සන්තකව පවත්නා කෝට්ටේ යුගයට අයත් තඹ සන්නස ඇතුළු පැරණි ලේඛන මූලාශ්‍රය කොටගෙන තිබේ.

සූරියගොඩ සඟ පරපුර ආරම්භ වන්නේ දඹදෙණි යුගයේ එනම් ශ්‍රී සංඝබෝධි විජයබාහු හෙවත් තුන්වන විජයබාහු (1232-1236) හෝ සිවුවන විජයබාහු (1270-1272) රාජ්‍ය සමයේදී ය. තත් ලේඛනයේ, '...මෙසේ කියන ලද පළමු මේ සිරිලක රජ පැමිණි උතුම් ශ්‍රී සංඝබෝධි ශ්‍රී විජයබාහු නරේන්ද්‍රොත්තමයාණන් වහන්සේට ගුරු තනතුරෙහි පිහිටි තැන් පටන් ශිෂ්‍ය පරම්පරාවට පැවත එන...' ආදී වශයෙන් එන විස්තරයෙන් පෙනීයන්නේ සූරියගොඩ සඟ පරපුරේ ආදිකර්තෘවරයා දඹදෙණියේ තුන්වන විජයබාහු හෝ සිවුවන විජයබාහු රජතුමාගේ රාජගුරු වශයෙන් කටයුතු කළ කිත්සිරිමෙවන් රාජසුන්දර මහතෙරුන් වහන්සේ බවයි.

ඒ අනුව වර්තමාන මල්වතු අස්ගිරි උභය මහාවිහාර සංඝයාගේ ආදිකර්තෘවරයාණන් වහන්සේ වන වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ සඟ පරපුර දඹදෙණි යුගය දක්වා දුරාතීතයකට දිවයන බව ඓතිහාසික ලේඛනයකින් සනාථ වීම මෙරට භික්ෂු වංශකථාව සම්බන්ධයෙන් වැදගත් කරුණකි.

සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහ විහාරය සන්තක පැරණි ලේඛනයට අනුව කාලානුක්‍රමිකතාව පදනම් කරගනිමින් තත් සඟ පරපුර පහත පරිදි පෙළගැස්විය හැකිය.[19]

---

[19]. ***සූරියගොඩ රජමහ විහාරය*** (2015), බණ්ඩාර, ආර්.ඩබ්. ප්‍රියදර්ශන සහ තවත් අය (සංස්.), ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, 47 පිටුව

කිත්සිරිමෙවන් රාජසුන්දර මහතෙරුන් වහන්සේ
(දඹදෙණි යුගය)

↓

වනරාජ මාපා මහතෙරුන් වහන්සේ (කුරුණෑගල යුගය)

↓

අරුන්දොර අභයරාජ මහතෙරුන් වහන්සේ (ගම්පොළ යුගය)

↓

වෑගම කිත්සිරිමෙවන් රාජසුන්දර මහතෙරුන් වහන්සේ
(පළමුවන විමලධර්මසූරිය යුගය)

↓

ඒදඬුවාවේ කිත්සිරිමෙවන් රාජසුන්දර උභය මහාවිහාර ප්‍රධාන
මහතෙරුන් වහන්සේ
(දෙවන විමලධර්මසූරිය යුගය)

↓

සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දරාභිධාන ප්‍රාප්ත වූ
සිල්වත් මහතෙරුන් වහන්සේ
(ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ යුගය)

↓

වැලිවිට පිණ්ඩපාතික අසරණසරණ
සරණංකර සංඝරාජ මාහිමි

↓

කිත්සිරිමෙවන් රාජසුන්දරාභිධාන විහාරේගෙදර
මහතෙරුන් වහන්සේ (කීර්ති ශ්‍රී රාජසිංහ යුගය)

↓

කිත්සිරිමෙවන් රාජසුන්දර මහතෙරුන් වහන්සේ

(රාජාධි රාජසිංහ යුගය)

↓

කිත්සිරිමෙවන් රාජසුන්දරාභිධාන ධම්මරක්ඛිත

මහතෙරුන් වහන්සේ

(ශ්‍රී වික්‍රම රාජසිංහ යුගය)

↓

කිත්සිරිමෙවන් රාජසුන්දරාභිධාන සීලවංස

මහතෙරුන් වහන්සේ

(ශ්‍රී වික්‍රම රාජසිංහ යුගය)

මෙම ලේඛනයෙන් ඉදිරිපත් වන වැදගත් කරුණක් වන්නේ දෙවන විමලධර්මසූරිය රාජ්‍ය සමයේදී (1687-1707) සූරියගොඩ විහාරයේ ආදිපත්‍යය දැරූ ඒදඬුවාවේ කිත්සිරිමෙවන් රාජසුන්දර මහතෙරුන් වහන්සේ උභය මහාවිහාරයේ ප්‍රධානත්වය දැරූ බව සඳහන් වීමයි.

පෞරාණික සූරියගොඩ කිත්සිරිමෙවන් රාජසුන්දර සඟපරපුරෙන් ජනිත වූ ප්‍රදීපස්ථම්භය වනාහි පසුව උපොසථාරාමය නිත්‍ය වාසය කොටගත් වැලිවිට සරණංකර සඟරජ මාහිමියන් ය. අභිනවයෙන් ප්‍රතිෂ්ඨිත වූ පුෂ්පාරාම විහාර භූමියේ ප්‍රථම සංඝාරාමය ගොඩනැංවෙන්නේ උන්වහන්සේ වෙනුවෙනි. 'වැලිවිට පංසල' යනුවෙන් හඳුන්වනු ලබන්නේ එකී සංඝාරාමයයි. මල්වතු මහාවිහාරයේ වැලිවිට, තිබ්බටුවාවේ, දරම්ටිපොල, ගිනිගත්පිටියේ, රඹුක්වැල්ලේ සහ මොරතොට

යනාදී සියලු සංඝ පරම්පරා බිහිව ඇත්තේ සරණංකර සංඝරාජ මාහිමියන්ගේ ආචාර්යත්වයෙනි.



මල්වතු මහාවිහාරයේ පැරණි සංඝාරාමයක්
මොරතොට පංසල

## කොබ්බෑකඩුව සඟ පරපුර

උපොසථාරාමයේ පෞරාණික භික්ෂු පරම්පරා පිළිබඳ අධ්‍යයනයේදී පල්කුඹුර රජමහ විහාර සන්නස වැදගත් මූලාශ්‍රයකි. කෝට්ටේ සිට කඳුරට බලා පැමිණි බුවනෙකබාහු නමැති මහතෙරුන් වහන්සේ උඩුනුවර උරුලෑවත්ත ප්‍රදේශයේ තාවකාලිකව වැඩ විසූහ. ඒ සමයේ කන්ද උඩරට පාලකයා වූයේ වික්‍රමබාහු රජතුමා ය. අනතුරුව ඔහු පුත් ජයවීර අස්ථාන කුමරු රාජත්වයට පත්විය. හෙතෙම උඩුනුවර උරුලෑවත්තේ වැඩසිටි

බුවනෙකබාහු මහතෙරුන් වහන්සේට සෙංකඩගල පුරයට වැඩම කරවා ***විසුද්ධිමාර්ගය*** පිටපත් කිරීම සඳහා ආරාධනා කළ බව සඳහන් වේ. ඊට පිරිනැමෙන ධර්ම පරිෂ්කාරයක් වශයෙන් බුවනෙකබාහු තෙරුන් වහන්සේට පල්කුඹුර බඩවැඩිල්ල නම් ගම්වරය ජයවීර රජතුමා විසින් පූජා කර තිබේ. පසුකලෙක සීතාවක රාජසිංහ රජතුමාගේ (1581-1593) ශාසනික සංහාරයට ගොදුරු වූ මුන්වහන්සේ ගිහියකු බවට පත්විය. උපැවිදි වූ හෙතෙම 'බුවනෙකබාහු පණ්ඩිත' නමින් ප්‍රකටව කන්ද උඩරට සෙනරත් රජතුමාගේ (1604-1635) රාජගුරු වශයෙන් කටයුතු කර තිබේ. සසුන්ගත කළ ඔහුගේ බෑණනුවන් ද 'බුවනෙකබාහු තෙරුන් වහන්සේ' නමින් ප්‍රකට විය.

දෙවැනි බුවනෙකබාහු තෙරුන් වහන්සේ පල්කුඹුර විහාරයේ සිදු කළ විහාර කර්මාන්ත පිළිබඳ පැහැදුණු ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා (1707-1739) විසින් දළදා වහන්සේගේ සහ දළදා මාලිගාව සම්බන්ධ රාජකාරි කටයුතු උන්වහන්සේට පවරන ලදී. එතැන් පටන් දළදා වහන්සේ සම්බන්ධ සියලු කටයුතු දෙවැනි බුවනෙකබාහු තෙරුන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර විසින් සිදු කරන ලද බවට තොරතුරු එම සන්නසින් ඉදිරිපත් වේ. පල්කුඹුර රජමහ විහාර සන්නසට අනුව බුවනෙකබාහු තෙරුන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර ලෙස උපොසථාරාමයේ කොබ්බෑකඩුව සඟ පරපුර ප්‍රකට වේ. කොබ්බෑකඩුවේ රාජගුරු සිරිනිවාස මහතෙරුන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර පල්කුඹුරේ බුවනෙකබාහු මහතෙරුන් වහන්සේගේ ශිෂ්‍යානු ශිෂ්‍ය පරපුර සමග ඇති සම්බන්ධයෙන් මල්වතු මහාවිහාර පාර්ශ්වීය

භික්ෂු පරම්පරාවේ අසම්භින්නතාවය මැනවින් හෙළි වේ.[20] උපොසථාරාම අවධියේ මෙන්ම පසුව පුෂ්පාරාම අවධියේ ද කොබ්බෑකඩුව සඟ පරපුර මල්වතු මහාවිහාරයේ අද්විතීය යතිවරුන් බිහිකළ සඟ පරපුරක් බව ප්‍රකට කරුණකි. වර්තමානයේ ද පල්කුඹුර රජමහ විහාරය මල්වතු මහාවිහාර පාර්ශ්වයට අයත් සම්භවනීය විහාරස්ථානයකි.

පෝයමළු විහාරය පිළිබඳ පුළුල් පර්යේෂණයක් සිදුකොට ඇති කුළුගම්මන ධම්මරක්ඛිත නාහිමියන්ගේ අදහස වන්නේ ගම්පොළ රාජධානි සමයෙන් පසුව උඩුනුවර ලංකාතිලක විහාරයේ වැඩසිටි දෙවාසයේ මහාසංඝයාගේ සංඝ මූලස්ථානය බවට උපොසථාරාම මහාවිහාරය පත් වූ බවයි.[21]

ලංකාතිලක පර්වත ලිපියේ එන අන්දමට එහි දෙවාසයේ මහාසංඝයාගේ පරිභෝගය වෙනුවෙන් සංඝාරාම දෙකක් කර වූ බව සඳහන් කර තිබේ.[22] ඒ අනුව ලංකාතිලක විහාරයේ වැඩසිටි දෙවාසයේ සංඝයා සෙංකඩගලපුර පිහිට වූ උපොසථාරාමයට වැඩම කළ බවත්, උන්වහන්සේලා මල්වතු මහාවිහාරීය සඟ

---

[20]. ධම්මරක්ඛිත හිමි, කුළුගම්මන (2004), 'සෙංකඩගලපුර උපොසථාරාමය හා එහි ඓතිහාසික පසුබිම', ***මල්වතු මහා විහාරය සහ මහ පදවිය***, විමලබුද්ධි හිමි, වල්ගොව්වාගොඩ ඇතුලු තවත් අය (සංස්.), මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ, 33-34 පිටු; **පල්කුඹුර සන්නස** '....මෙම (පල්කුඹුර) විහාරස්ථානයෙහි පුදසිරිත් අඛණ්ඩව පවත්වන ශටියට....උපෞසථාරාමවාසී කොබ්‍යාකඩුවේ රාජගුරු ශ්‍රීනිවාස මහාස්ථවිරපාදයන් වහන්සේගේ සිශ්‍ය වූ පල්කුඹුරෙ භුවනෛකබාහු උන්නසෙස්ගේ සිශ්‍යානුසිශ්‍ය පරම්පරාවට මෙම විහාරස්ථානයෙහි පුදඹිලක්කම් පවත්වා එයින් ලත් ප්‍රත්‍යයෙන් සංඝයා වහන්සේට ප්‍රයෝජන විඳිනා ශටියට...'

[21]. ධම්මරක්ඛිත හිමි (2004), 35 පිටුව

[22]. Paranavitana (1960), pp. 04-06

පරපුර සමග බද්ධ වූ බවත් පෙන්වාදිය හැකිය.[23] වර්තමානයේ උපොසථාරාම පරිශ්‍රයේ පිහිටි අමුණුගම පංසල මෙකී ඓතිහාසික සබැඳියාවට ජීවමාන උදාහරණයකි. ඒ සමග සම්බන්ධ වන ලංකාතිලක රජමහ විහාරය, මාවෙල රජමහ විහාරය, කොබ්බෑකඩුව රජමහ විහාරය සහ පුසුල්පිටිය රජමහ විහාරය තත් සඟ පරපුරේ පෞරාණිකත්වය වටහාගැනීමට උපකාරී වේ.

## පුෂ්පාරාම මහාවිහාරය හෙවත් මල්වතු මහාවිහාරය

අද්‍යතනයේ 'මල්වතු මහාවිහාරය' යන පොදු නාමයෙන් ව්‍යවහාරයට පත්ව ඇත්තේ පෞරාණික පෝයමළු විහාරය, සංඝරාජ පිරිවෙන සහිත පෝයමළුවේ සංඝාරාම සංකීර්ණයත්, යාබද පුෂ්පාරාම මහාවිහාරයේ මංගල උපොසථාගාරය සහිත ද්වත්තිංශාධික සංඝාරාම සංකීර්ණයත්, ඊට අනුබද්ධ මහානායක නිල ආරාමය, භික්ෂු නේවාසිකාගාරය සහිත සමස්ත විහාර සංකීර්ණයත් ය. එමෙන්ම තදාසන්නව පිහිටි ලේවැල්ල ගංගාරාම රජමහ විහාරය සහ වල්ගම්පාය අභයරාජ පිරිවෙන් රජමහ විහාරය ආදී අතිසම්භාවනීය පූජ්‍යස්ථාන ද මීට ඇතුළත් වේ.

රුහුණුරට මූලගිරි රජමහ විහාරය, තිස්සමහාරාම රජමහ විහාරය, කිරිවෙහෙර රජමහ විහාරය, සිතුල්පව්ව රජමහ විහාරය සහ කසාගල රජමහ විහාරය යනාදියත්, රිදීවිහාරය, දනගිරිගල රජමහ විහාරය, සැලව රජමහ විහාරය, හිඳගල රජමහ විහාරය, දෙගල්දොරුව රජමහ විහාරය, කල්‍යාණී රජමහ විහාරය, අත්තනගලු රජමහ විහාරය, දඩගමුව රජමහ විහාරය,

---

[23]. ***මල්වතු මහාවිහාර වංශය*** (1989), 06 පිටුව

දොරණෑගොඩ රජමහ විහාරය, දැදිගම රජමහ විහාරය, හිඟුල රජමහ විහාරය, ගඩලාදෙණිය සද්ධර්මතිලක රජමහ විහාරය, ලංකාතිලක රජමහ විහාරය, සූරියගොඩ ශ්‍රී නරේන්ද්‍රාරාම රජමහ විහාරය, හඟුරන්කෙත පොත්ගුල් මාලිගා මහාවිහාරය, පුසුල්පිටිය රජමහ විහාරය, වරාවල රජමහ විහාරය, රංකිරිමඩ රජමහ විහාරය, පෙරියකඩුව රජමහ විහාරය, බිංගිරිය දේවගිරි රජමහ විහාරය, පාදෙණිය රජමහ විහාරය සහ ඌවේ පොතුබන්දන රජමහ විහාරය යනාදී පෞරාණික මහාවිහාරත්, පිහිටිරට ශ්‍රී මහා බෝධිද්‍රැමය, රත්නමාලී මහාචෛත්‍යය ප්‍රධාන කොටගත් අටමස්ථානය ද, ගෞතම ශ්‍රීපාදස්ථානය ද ඇතුළු දෙදහස් හාරසියයකට අධික පෞරාණික වෙහෙර විහාර මල්වතු මහාවිහාර පාර්ශ්වයට ඇතුළත්ව තිබීම මල්වතු මහාවිහාරය වඩාත් උද්දීප්තියට පත්වීමෙහිලා හේතු වී තිබේ.

එපමණක් නොව මෑත අතීතයේ ලංකාදීපවාසී මහාසංඝයාගේ ධර්මශාස්ත්‍ර භාෂා ශාස්ත්‍රොන්නතියේ ප්‍රදීපස්ථම්භ බඳු වූ හික්කඩුවේ ශ්‍රී සුමංගල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පිහිටුවා වදාළ මාලිගාකන්ද විද්‍යොදය මහපිරිවෙණ හා රත්මලානේ ශ්‍රී ධර්මාලෝක මහාස්වාමීන්ද්‍රයන් වහන්සේ විසින් පිහිටුවා වදාළ පෑලියගොඩ විද්‍යාලංකාර මහපිරුවන මල්වතු මහාවිහාරය හා බැඳී පැවතීම සැලකිය යුතු කරුණකි.

## පුෂ්පාරාම විහාරය ප්‍රතිස්ථාපනය සහ එහි ඓතිහාසික විකාශනය

වර්තමානයේදී පුෂ්පාරාම විහාරය චිරප්‍රසිද්ධියට පත්ව ඇත්තේ මල්වතු මහාවිහාරය යනුවෙනි. මල්වතු වෙහෙර, මල්වතු පාර්ශ්වය යනුවෙන් ද මෙය ව්‍යවහාරයට පත්ව තිබේ. මීට

ඒ නම යෙදී ඇත්තේ උපොසථාරාමයට යාබදව, ශ්‍රී දංෂ්ට්‍රාධාතු මන්දිරය සහිත රාජකීය නගරාංගවලින් සමන්විත අගනුවර පිහිටි රාජකීය පුෂ්පොද්‍යානය තුළ මෙම ආරාමය ගොඩනංවා තිබීම හේතුවෙනි. බුදුන් වහන්සේ ධරමාන සමයේ මෙන්ම ලක්දිව බුදුසසුන පිහිටුවන ලද මුල් කාලයේ පටන් රාජකීය උද්‍යාන සංඝාරාම වශයෙන් පිදූ බව ශාසන ඉතිහාසයෙන් පැහැදිලි වේ. ඒ අනුව කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ ශාසන පුනරුද ව්‍යාපාරයෙන් ද, අභිනවයෙන් සිදුකෙරෙන ස්‍යාමොපසම්පදා මංගල්‍යයෙන් ද ප්‍රමුදිතව ඊට කෙරෙන සංග්‍රහයක් වශයෙන් රාජකීය පුෂ්පොද්‍යානය සඟසතුකොට පූජා කර තිබේ.

එසේ වුව ද මල්වතු මහාවිහාර භූමිය කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා සඟසතුකොට පූජා කිරීමට පෙර පටන්ම ශාසනික කටයුතු සඳහා යොදාගත් බවට තොරතුරු හමු වේ. මේ පිළිබඳ සමකාලීන තොරතුරු වාර්තා කරන වැදගත් මූලාශ්‍රයක් වනුයේ ***රාජරත්නකාරයයි.*** එහි සෙංකඩගල නුවර වීරවික්‍රම රජතුමාගේ ශාසනික කටයුතු පිළිබඳ දීර්ඝ වශයෙන් විස්තර කොට තිබේ.

එහිලා පෝයමළු විහාරය හෙවත් උපොසථාරාමය ඇතුළු විහාරාරාම කරවීම පිළිබඳ දක්වන විස්තරයේදී **'චිත්‍රකූටගෙය'** පවිත්‍ර කරවා මනාව සරසවා රාත්‍රී බණ පනස්පහක් දේශනා කර වූ බව සඳහන් වේ. මෙම **චිත්‍රකූටගෙය** රජමාලිගය හා සම්බන්ධ රාජකීය පුෂ්පොද්‍යානයේ තිබී ඇත. එය උපොසථාරාම

භික්ෂූන්ගේ ධර්මදේශනාදී ශාසනික කටයුතු සඳහා ද යොදාගෙන තිබේ.[24]



මේ පිළිබඳ ධම්මරක්ඛිත නාහිමියන්ගේ අදහස වනුයේ වර්තමාන මල්වතු මහාවිහාර උපොසථාගාරය පිහිටා ඇති භූමිභාගයේ 'ධම්මිකාරාමය' යනුවෙන් හඳුන්වන ලද ආරාමයක් පැවති බවත්, එය වීරවික්‍රම රජතුමා විසින් කරවන ලද ආරාම අසූහයෙන් එකක් බවත් ය. පළමුවන විමලධර්මසූරිය (1592-1604) සහ දෙවන විමලධර්මසූරිය (1687-1707) යන රජවරුන් විසින් රක්ඛංග දේශයෙන් උපසම්පදාව ගෙනඒමේදී එකී භික්ෂූන්ගේ වාසය සඳහා සෙනසුන් පිළියෙලකොට දී ඇත්තේ ද පුෂ්පාරාම විහාර

24. ***රාජරත්නාකරය*** (1995), 136 පිටුව

භූමියේ ය. එහිදී වීරවික්‍රම රජතුමා කර වූ ධම්මිකාරාමය පිළිසකර කරවා එම භික්ෂූන්ට ලබාදෙන්නට ඇති බව ධම්මරක්ඛිත නාහිමියන්ගේ අදහසයි.[25] එමගින් පෙනීයන්නේ මෙම අවධිය වන විටත් උපොසථාරාමය ප්‍රතිබල සම්පන්න භික්ෂූන් වැඩසිටි ප්‍රධාන සංඝ සංවිධානයක් වශයෙන් පැවති ආකාරයයි. යථෝක්ත උපසම්පදා දෙකෙහිදීම උපොසථාරාම සංඝයාට ප්‍රමුඛතාව ලැබී ඇති බව රක්ඛංග මහතෙරුන් වහන්සේලා පෝයමළු විහාරයට යාබද ධම්මිකාරාමය හෙවත් පුෂ්පාරාම විහාර භූමියේ වඩාහිඳුවීමෙන් පෙනීයයි. මෙම තොරතුරුවලට අනුව මල්වතු මහාවිහාර භූමියේ ශාසනික සබැඳියාව ස්‍යාමොපසම්පදාවටත් පූර්ව අවධිය දක්වා දිවෙන බව පැහැදිලි ය. එපමණක් නොව පුෂ්පාරාම පරිශ්‍රයේ පැවති චිත්‍රකූට මණ්ඩපය ස්‍යාමොපසම්පදාවේදී 'විසුංගාම සීමාව' වශයෙන් සම්මත කරගෙන ඇති අතර පසුව බද්ධසීමාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දේ ද එකී මණ්ඩපය සහිත භූමියේ ය.[26]

රක්ඛංග උපසම්පදා විනය කර්මය සඳහා ලක්දිවට වැඩම කළ මහතෙරුන් වහන්සේලා පුෂ්පාරාම විහාරයේ වැඩවාසය කර වූ බවක් ***මහාවංසයේ*** සඳහන් නොවෙතත්, අදාළ කොටස රචනා කළ තිබ්බටුවාවේ බුද්ධරක්ෂිත මාහිමියන් විසින් සම්පාදිත ***ස්‍යාමොපසම්පදාවත*** වාර්තා කරන්නේ රක්ඛංග දේශයෙන් වැඩමකළ මහතෙරුන් වහන්සේලා සිරිවර්ධනපුරාසන්න වූ පුෂ්පාරාම විහාරයේ වඩාහිඳුවා උපස්ථාන කළ බවයි. මේ බව

[25]. ධම්මරක්ඛිත හිමි (2004), 44 පිටුව

[26]. ***මල්වතු රාජාවලිය*** පුස්කොළ පොත (අමුද්‍රිත); ***ස්‍යාමොපසම්පදාවත*** (2013), මේධංකර හිමි, තිබ්බටුවාවේ (සංස්.), කර්තෘ ප්‍රකාශන, මහනුවර, 50 පිටුව

***සුළුරාජාවලිය*** ද වාර්තා කරයි[27] මල්වතු මහාවිහාරවාසී අමුණුගම රතනපාල හිමියන් සතු පැරණි ලේඛනයකින් ද ඒ බව තහවුරු කෙරෙන බව හේනේපොළ නන්දසිරි නාහිමියෝ පෙන්වාදෙති;

> ...සැසනමාමක ලජ්ජිපෙසල සංඝයාගේ අභාවයෙන් ඒ කටයුතු පිරිහී තිබෙන ප්‍රස්ථාවට ප්‍රථම විමලධර්මසූරිය රජතුමාණෝ රජ පැමිණ රක්ඛංග දේශයෙන් සංඝයා වැඩමවා මේ **මල්වත්ත විහාරයේ** වඩාහිඳුවා උපස්ථාන කෙරෙමින් ආගම වර්ධනය කර වදාළා ය....[28]

රජතුමා විසින් පුෂ්පාරාම භූමියේ රක්ඛංග මහතෙරුන් වහන්සේලාට වාසස්ථාන පිළියෙල කරදීමට ප්‍රධාන වශයෙන්ම හේතුවන්නට ඇත්තේ ඒ ආශ්‍රිතව පැවති ආගමික පරිසරය වන්නට පුළුවන. විශේෂයෙන්ම තදාසන්නව උපොසථාරාමය පැවතීමත්, දළදා මාලිගාව සහ රජමාලිගය සමීප දුරකින් පැවතීමත් මීට හේතුවූවා විය හැකිය.

ඇතැම්හු උපොසථාරාමය අස්ගිරි මහාවිහාරයට අයත් බවට අදහස් පළ කළ ද, රක්ඛංගදේශ දූත ප්‍රයාණය සහ අරත්තන තුඩපත වැනි මූලාශ්‍රය රැසකින් එකී අදහස නිශේධනය වේ. ඒ අනුව ස්‍යාමොපසම්පදා සමය වන විටත් උපොසථාරාමය සහ අස්ගිරි විහාරය පැහැදිලි අනන්‍යතාවක් සහිතව, ගණනායකවරු දෙනමක් යටතේ පාලනය වූ ආයතන දෙකක් බව පැහැදිලි ය.

---

27. ***සුළුරාජාවලිය*** (1914), විද්‍යාලෝක මුද්‍රණාලය, බුත්ගමුව, 23, 25 පිටු; ***ස්‍යාමොපසම්පදාවත*** (2013), 38, 41 පිටු

28. නන්දසිරි හිමි, හේනේපොළ (1978), ***මල්වතු මහාවිහාරයේ ප්‍රභවය, සංවිධානය සහ විකාශනය***, ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය (අමුද්‍රිත), 14 පිටුව

රක්ඛංගදේශ දූත ප්‍රයාණය රචනා වූ කාලසීමාවේදී උපොසථාරාමයේ ගණනායකත්වය දරා ඇත්තේ 'සෞසීලාාදී ගුණගණාංග සංගත කොබ්බෑකඩුවේ සිරිනිවාස උන්නාන්සේ' ය. අස්ගිරි විහාරයේ ගණනායකත්වය දරා ඇත්තේ 'අල්පේච්ඡ සන්තුෂ්ටාදී අමිත ගුණාන්විත වූ නාවින්නේ ධම්මදස්සි උන්නාන්සේ' ය. මෙකී විහාරද්වය සහ ගණනායකවරු දෙනම එක හා සමානව වර්ණනා කිරීමට රක්ඛංගදේශ දූත ප්‍රයාණයේ ලේඛකයා විශේෂ අවධානයක් යොමුකර ඇති බව රචනා විලාශයෙන්ම පෙනීයයි.[29]

විහාර දෙක එකම ශාසන සම්ප්‍රදායකට අයත් ස්වාධීන ආයතන දෙකක් බව අරත්තන තුඩපතින් පැහැදිලි වේ;

> ...ත්‍රිසිංහලාධීශ්වර උතුම් විමලධර්මසූරිය මහාරාජොත්තමයාණන් වහන්සේ සෙංඛණ්ඩ ශෛලාභිධාන ශ්‍රීවර්ධනපුරප්‍රවරයෙහි රාජ්‍යශ්‍රීයට පැමිණ වදාරමින්... සෞසීලාාදී ගුණයෙන් යුක්ත මහතෙරුන් වහන්සේලා තිස්තුන්නමක් රක්ඛංග දේශයෙන් වැඩමවා **විහාර දෙකේ** සාමණේර තැන් උපසම්පදා කරන වේලාවේ...

ඉහත විස්තරයෙන් පෙනීයන්නේ එසමය වන විට විහාර දෙකේම උපසම්පදාව අභාවයට පත්ව තිබූ නිසා විහාර දෙකේ සාමණේරවරුන් උපසම්පදා කිරීමේ අභිප්‍රායෙන් රජතුමා කටයුතු කළ බවයි. අරත්තන රජමහ විහාරය අස්ගිරි මහාවිහාර පාර්ශ්වයට

---

[29]. ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1969), ***මධ්‍යම ලංකා පුරාවෘත්ත***, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 102 පිටුව

අයත් විහාරයකි. අරත්තන තුඩපතේ ස්ථාන කිහිපයකම 'අස්ගිරි විහාරේ ගණනායක පදවිය' යනුවෙන් පැහැදිලිව සඳහන් වේ.[30]

මේ අනුව මල්වතු මහාවිහාර පාර්ශ්වීය භික්ෂු සංඝයාට චිරාගතව පැවත එන අනන්‍යසාධාරණ ශාසනවංශයක් නොමැත යැයි කිසිවකුට ප්‍රකාශ කළ නොහැකිය. එසමය වන විටත් උපොසථාරාමය වඩාත් කැපීපෙනෙන්ට ඇත්තේ බොහෝදෙනා සඳහන් කරන පරිදි එය ග්‍රාමවාසයට සම්බන්ධ, රාජකීයයන් සමග සමීපව කටයුතු කළ මෙන්ම විශාල භික්ෂු පිරිසකින් සමන්විත වූ නිසා ය. මෙම තත්ත්වය ස්‍යාමොපසම්පදා සමයෙන් ඉක්බිතිව ඉංග්‍රීසි පාලන සමය තුළ මෙන්ම වර්තමානය දක්වා ද නිරායාසයෙන් ඓතිහාසිකව උරුම වූ ප්‍රමුඛතාවයක් වශයෙන් හැඳින්වීම වඩා නිවැරදි ය.

## පුෂ්පාරාම විහාර පූජාව

පරිහානියට පත්ව තිබූ බුදුසසුන පුනරුදය වනුයේ කීර්ති ශ්‍රී රාජසිංහ රාජ්‍ය සමයේදී වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන්ගේ අප්‍රතිහත උත්සහය හේතුවෙනි. එකී පුනරුදයේ කේන්ද්‍රස්ථානය බවට පත්කරගෙන ඇත්තේ පෙර සඳහන් කළ පරිදි පුෂ්පාරාම මහාවිහාරයයි. විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන වැනි ලේඛනවල සරණංකර සඟරජ මාහිමියන් හඳුන්වා ඇත්තේ 'පවිත්‍ර චාරිත්‍ර සමස්ත ධර්මධුර ශීලව්‍රත සඟධූත

30. ධම්මානන්ද හිමි (1969), 175-176 පිටු

ගුනෙක භාජන සංඝගණ නිසෙවිත මනෝරම්‍ය පුෂ්පාරාම විහාරවාසී වැලිවිට සරණංකර උන්නාන්සේ' යනුවෙනි.[31]

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ පුෂ්පාරාම පූජාවෙන් පසුව උන්වහන්සේගේ නිත්‍ය නිවාසස්ථානය බවට පත්වන්නේ පුෂ්පාරාම මහාවිහාරයයි. ***මහාවංසය*** වාර්තා කරන ආකාරයට ස්‍යාම දේශයෙන් වැඩමකළා වූ ප්‍රවර උපාලි මහතෙරුන් වහන්සේ ඇතුළු තෙරුන් වහන්සේලාට වාසස්ථාන පිළියෙල කරදීම සඳහා සූදානම් කර ඇත්තේ ද පුෂ්පාරාම විහාර භූමියයි;

> ...ලංකාධිපති මහරජ තෙමේ... පෙරගමන් කොට උතුම් වූ මහතෙරුන් ආදී මහසංඝයා වැඳ... තුනුරුවන් පෙරටුකරගෙන සිය පුරයට අවුත් **පුෂ්පාරාමයෙහි** මනා තැනෙක කරවන ලද මනරම් වූ උළු සෙවෙණි ඇති අලංකෘත සංඝාරාමයෙහි ප්‍රවර ඒ භික්ෂු සංඝයා වස්වා ඉන්පසු සකස්කොට (සිවු)පසයෙන් උපස්ථාන කෙරෙමින් දවස් පතා සැපදුක් පිළිවිසිනට ඇමතියනුදු නියෝග කළේ ය....[32]

මේ අනුව පෙනීයන්නේ ස්‍යාම මහතෙරුන් වහන්සේලා ලක්දිවට වැඩම කිරීමටත් පෙර පුෂ්පාරාම විහාර භූමිය හොඳින් සූදානම්කොට තැබූ බවයි. උළු සෙවෙණි කරන ලද සංඝාවාස පිළිබඳ සඳහන් වීමෙන් ඒ බව පැහැදිලි වේ. ස්‍යාමොපසම්පදාවෙන් අනතුරුව දෙවැනිවර මෙරටට වැඩමකළ

---

[31]. ධම්මානන්ද හිමි (1969), 49 පිටුව

[32]. ***මහාවංසය*** ද්විතීය භාගය (2015), 100 පරි. 87-90 ගාථා

ස්‍යාම මහතෙරුන් වහන්සේලා සඳහා නේවාසික පහසුකම් සලසාදී ඇත්තේ ද මෙහිම ය;

> ...ඒ සංඝයා මෙහි පැමිණි කල මහායසස් ඇති ලක්රජ තෙමේ පෙර සෙයින් මහත් ගෞරවයෙන් නුවරට වඩාගෙනවුත් **මල්වතු වෙහෙර** වස්වා සාදරයෙන්ම දවස් පතා නිතිබත් ආදී සියල්ල පෙර යම් සේ නම් පසුත් එසේම දුන්නේ ය....[33]

පුෂ්පාරාම පරිශ්‍රයේ ධර්මශාලාවක් පැවති බව මූලාශ්‍රය කිහිපයකම වාර්තා වන කරුණකි. ස්‍යාම දේශයෙන් ලක්දිවට වැඩමකළ ප්‍රවර උපාලි මහතෙරුන් වහන්සේ ඇතුළු දූත පිරිස එම ධර්මශාලාව විසුංගාම සීමාවක් වශයෙන් ගෙන ප්‍රථම උපසම්පදා විනය කර්මය සිදුකොට වදාළේ ස්‍යාම දේශයෙන් වැඩම කළ සාමණේර නමක් උපසම්පදා කිරීමෙනි. ඉනික්බිතිව යථොක්ත ධර්මශාලාව බද්ධසීමාවක් වශයෙන් සම්මතකොට මෙරට භික්ෂූන්ගේ උපසම්පදා විනය කර්මය සිදු කර තිබේ. ඒ පිළිබඳ සමකාලීන මූලාශ්‍රයක් වන ***සංඝරාජ සාධු චරියාව*** වාර්තා කරන්නේ මෙපරිද්දෙනි;

> ...ඉන්පසු **මල්වත්තේ විහාරේ** මැද තනා තිබුණ ශාලාව පෝයගෙට ගන්නා පිණිස විසුංගාම සීමාව ලබන ලෙසට උපාලි මහාස්ථවිර සාමි සැලකළ තැනේදී එම ලෙසටම ඒ වැඩිය මහාසංඝයා වහන්සේට ඒ ස්ථානේ විසුංගාම සීමා වශයෙන් ලැබුණා ය. ඉන්පසු ඒ

---

[33]. ***මහාවංසය*** ද්විතීය භාගය (2015), 100 පරි. 142-143 ගාථා


විසුංගාම සීමාවේදී සුගත වර්‍ෂයෙන් දෙදාස් දෙසිය අනූ සවෙනි වර්‍ෂයෙහි ඇසළ පුර පසළොස්වක් ලත් දිනයෙහි දේසෙන් ආ අමාත්‍ය කෙනෙක් යානාවකින් පෙරහර වශයෙන් ගෙනවුත් දේසෙන් වැඩිය උන්නාසේලා විසින් පළමුවෙන්ම උපසම්පදා කොට දෙවෙනිව කොබ්බෑකඩුවේ නායක උන්නාන්සේ ද සංඝරාජ සාමින් වහන්සේ ද හුලංගමුවේ ලොකු උන්නාසේ ද බඹරදෙණියේ ලොකු උන්නාන්සේ ද තිබ්බටුවාවේ නායක උන්නාන්සේ ද අස්ගිරි විහාරේ නාවින්නේ නායක උන්නාන්සේ ද ලංකාවාසී සෑම සංඝයාට පළමුවෙන්ම මෙම පිළිවෙලින්ම උපාලි මහාස්ථවිර සාමි උපාධ්‍යාය කොට බ්‍රහ්මජෝති කම්මවාචා සාමි මහාපුඤ්ඤ කම්මාවාචා සාමි යන දෙනම ආචාර්‍ය්‍ය කොට අතිරේක දශවර්ගී මහාසංඝයා කෙරෙහි උපසම්පදා කොට පෙරවස් විසීමට ඒ සනම පළමුකොට ගත්තා ය...[34]

මේ ආකාරයට පෝයමළු, අස්ගිරි ගණදෙටු මූලස්ථාන උපසම්පදා කර්මය සඳහා යොදා නොගෙන, ධම්මිකාරාමය හෙවත් පුෂ්පාරාමයේ ධර්මශාලාව මේ සඳහා යොදාගැනෙන්නට ඇත්තේ අභිනව උපසම්පදාවේ පාරිශුද්ධියත්, සංඝ සාමග්‍රීයත් සලකා සරණංකර සාමණේරයන්ගේත්, උපාලි මහතෙරුන් වහන්සේගේ හා රජතුමාගේ අභිමතය පරිදි ය.[35]

---

34. ***සංඝරාජ සාධු චරියාව*** (1997), 18-19 පිටු

35. නන්දසිරි හිමි (1978), 23 පිටුව; ධම්මරක්ඛිත හිමි (2004), 44 පිටුව



වර්ෂ 1870 දශකයේ උපසම්පදා විනය කර්මය පැවැත් වූ
ආකාරය දැක්වෙන සිතුවමක්

පුෂ්පාරාම විහාරය පූජා කිරීම පිළිබඳ අදහස් දෙකක් පවත්නා බව පෙනේ. එක් අදහසක් වන්නේ පුෂ්පාරාම විහාරය සරණංකර සාමණේරයන්ට පිදූ බවයි. අනෙක් අදහස නම් ස්‍යාම දේශයෙන් වැඩි උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රමුඛ සංඝයාට එය පිදූ බවයි. සරණංකර සාමණේරයන්ට පුෂ්පාරාම විහාරය පූජා කරන ලද්දේ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා විසින් යැයි ***ස්‍යාමොපසම්පදාවතේ*** සඳහන් වන්නේ මෙසේ ය;

...එකල්හි යට කියන ලද ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ
නම් මහරජාණෝ භික්ෂු සංඝයා ඇති කලැ පැවිදිලත්

> මේ ශරණංකරාභිධාන සාමණේරයන් වහන්සේ ශික්ෂාකාමී ලජ්ජිපේශල සේකැයි දැන හැඳින **පුෂ්පාරාම විහාරය** පුදකොට ශබ්ද ශාස්ත්‍ර සද්ධර්මාගම වර්ධනයට සහයව...[36]

මෙහිදී සරණංකර සාමණේරයන් වහන්සේ උපසම්පදා භික්ෂූන් වැඩසිටි කාලයේ පැවිදි බව ලැබීමත්, උන්වහන්සේගේ ගුණ නුවණත් බුද්ධරක්ෂිත මාහිමියන් විශේෂයෙන් වාර්තාකොට තිබේ. එසේ වුව ද බුද්ධරක්ෂිත මාහිමියෝ ***මහාවංසය*** රචනා කිරීමේදී සරණංකර සාමණේරයන්ට පුෂ්පාරාමය පිදූ වග වාර්තා කොට නොමැත. එනමුත් උන්වහන්සේ විෂයෙහි කරන ලද ප්‍රදාන පිළිබඳ ප්‍රමාණවත් විස්තරයක් සපයා තිබේ. ඒ අනුව ධර්ම පුස්තක ද, චීවරාදී ප්‍රත්‍ය පහසුකම් සහ කැපකරුවන් ප්‍රදානය කළ බවත්, ග්‍රන්ථකරණය සඳහා ආරාධනා කළ බවත් එහි වාර්තා කොට තිබේ.[37]

කෙසේ වෙතත් දළදා මාලිගාවේ අභිනව කර්මාන්ත, ප්‍රතිසංස්කරණ මෙන්ම විහාර කර්මාන්ත රාශියක් කර වූ නරේන්ද්‍රසිංහ රජතුමා පුෂ්පාරාම විහාරයේ සංඝාරාම ඉදිකරවන්නට ඇතැයි සිතිය හැක්කේ එය සරණංකර සාමණේරයන්ට පිදූ බව වාර්තාවීමෙනි. අනෙක් කරුණ වන්නේ කීර්ති ශ්‍රී රාජසිංහ සමය වන විට පුෂ්පාරාම පරිශ්‍රයේ උළු සෙවෙණි ඇති අලංකෘත සංඝාරාම පිළිබඳ වාර්තාවීමයි. ස්‍යාමොපසම්පදාව සඳහා වැඩමකළ ප්‍රවර උපාලි මහතෙරුන්

---

[36]. ***ස්‍යාමොපසම්පදාවත*** (2013), 46 පිටුව

[37]. ***මහාවංසය*** ද්විතීය භාගය (2015), 97 පරි. 56-58 ගාථා

වහන්සේ ප්‍රධාන දූත පිරිස වඩාහිඳුවන්නේ ද මෙම සංඝාරාමය තුළ ය. මේ අනුව වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ අවධියත්, කීර්ති ශ්‍රී රාජසිංහ අවධියත් අතර කාලයේ ද උපොසථාරාමය කේන්ද්‍ර කරගනිමින් පුෂ්පාරාම පරිශ්‍රයේ සරණංකර සාමණේරයන්ගේ ශිෂ්‍ය බාලාදීන් වාසය කරන්නට ඇත. එනමුත් එය පූර්ණ සංඝාරාමයක් වශයෙන් ස්ථාපිතව නොතිබෙන්නට ඇත. මෙනිසා සරණංකර සාමණේරයන් කෙරෙහි අතිප්‍රසන්නව සිටි නරේන්ද්‍රසිංහ රජතුමා උන්වහන්සේ ඇතුළු සිල්වත් සමාගමේ කටයුතු වෙනුවෙන් එය පූජා කරන්නට ඇතැයි සිතිය හැකිය.

කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා පුෂ්පාරාමය සරණංකර සාමණේරයන් වෙත පිදූ බව ***කොළමුන්නේ මුදියන්සේගේ රාජාවලිය*** නමැති පුස්කොළ පොතෙන් පෙනීයයි. සමකාලීනව රචනා වී ඇති එකී ලේඛනයේ මෙසේ සඳහන් වේ;

> ...දෙවනපෑතිස්සාදී පින්වත් නරේන්ද්‍රයෝ පවා ප්‍රතිපත්ති සාර භික්ෂූන්ගේ සහායෙන් ශාසනය පවත්වා ආ හෙයින් අප විසිනුදු දුසිල්වත් සඟනමක් සහය කොටගෙන ශාසනෝපකාර කටයුතු යන පූර්වතර වීරවංශානුගත උදාරාධ්‍යාස ඇතිව ධර්මාන්විත ප්‍රතිපත්ති පුරන්නා වූ යටකී සරණංකර සාමණේරයන් වහන්සේට **පුෂ්පාරාම විහාරය** පිළිගන්වා සිවුපසයෙන් උපකාර කෙරෙමින්...[38]

[38]. ***කොළමුන්නේ මුදියන්සේගේ රාජාවලිය*** පුස්කොළ පොත (අමුද්‍රිත)

ඉහත විස්තරයෙන් සරණංකර සාමණේරයන් වෙත පුෂ්පාරාම විහාරය පූජා කිරීමේ අපේක්ෂාව මැනවින් පැහැදිලි වේ. මේ පිළිබඳ විසිතුරු වර්ණනාවක් රක්ඛංගදේශ දූත ප්‍රයාණයේ ද දක්නට ලැබේ. එහි විශේෂයෙන් වාර්තා වී ඇත්තේ පුෂ්පාරාම විහාරය නැවත ස්‍යාම දේශයෙන් වැඩි උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රමුඛ කොට නවක මධ්‍යමාදී භික්ෂූන්ට පිදූ බවයි.[39] සතර දිසාවෙන් වඩින මහාසංඝයා වහන්සේලාට සාංඝික කොට වදාරන ලද මල්වතු මහාවිහාරය උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රධාන සංඝයාට පිදූ බව රක්ඛංගදේශ දූත ප්‍රයාණය වාර්තා කිරීමෙන් පෙනීයන්නේ මෙය ඊට පෙර සඟසතුකොට පුදන ලද කිසියම් සංඝාරාම ප්‍රමාණයකින් සමන්විත පරිශ්‍රයක් වූ බවයි. ඒ අනුව සරණංකර සාමණේරයන්ට පූජා කරන ලද පුෂ්පාරාම විහාරය ස්‍යාම තෙරුන් වහන්සේලාට ද වාසස්ථානය වශයෙන් පූජා කළ බව පෙනේ.

වර්තමානයේදී මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මූලස්ථානය හැඳින්වීම සඳහා පොදුවේ භාවිත කෙරෙන 'මල්වතු විහාරය' යන්න මුල්කාලයේ පටන් භාවිත කරන ලද්දක් බව ද රක්ඛංගදේශ දූත ප්‍රයාණයෙන් පැහැදිලි වේ. ***මන්දාරම්පුර පුවතේ*** ද 'මල්වතු වෙහෙර' යන්න දක්නට ලැබේ.[40] කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා පුෂ්පාරාම විහාරය පූජා කිරීම පිළිබඳ විචිත්‍රවත් වර්ණනාවක් රක්ඛංගදේශ දූත ප්‍රයාණයේ අන්තර්ගත ය. එමගින් මල්වතු

---

39. ධම්මානන්ද හිමි (1969), 102 පිටුව

40. ***මන්දාරම්පුර පුවත*** (1958), ලංකානන්ද හිමි, ලබුගම, (සංස්.), සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ, 678 කවිය

විහාරය ප්‍රතිෂ්ඨාපනය කළ රාජකීය පුෂ්පොද්‍යානයේ විසිතුරු බව වර්ණනා කර තිබේ;

> ...ශ්‍රී දන්ත ධාතුන් වහන්සේගේ මන්දිරය පිහිටි ස්ථානයට දක්ෂිණ දිශාභාගයෙන් සුප්‍රතිෂ්ඨිත... සුරලෝකාවතීර්ණ සුන්දර විමානයක් මෙන් **සකල සත්ව නයන රසායන වූ මල්වතු විහාරය** සකවර්ෂ එක්වාදහස් සසිය හැත්තෑපහට පැමිණි ශ්‍රීමුඛ නම් වර්ෂයෙහි පොසොන් මස පුර සතවක් නම් තිථියලත් සිකුරාදා මෙදවස පස්වරු භාගයෙහිදී සියම් දේශයෙන් වැඩිය උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රමුඛකොට නවක මධ්‍යමාදී භික්ෂූන් වහන්සේලාට පූජා කර වදාරමින්...[41]

මෙමගින් පෙනීයන්නේ උපසම්පදා මංගල්‍යය සඳහා ලක්දිවට වැඩමවන ස්‍යාම මහතෙරුන් වහන්සේලා පිළිගැනීම වෙනුවෙන් මල්වතු විහාරය කෙතරම් සම්භාවනීය ආකාරයට සූදානම් කළේ ද යන්නයි. එක් අතකින් එය රාජ්‍යතාන්ත්‍රික පිළිගැනීමක් මෙන්ම චිරාගත චාරිත්‍ර ධර්මයක් ද විය. ඒ සඳහා තෝරාගත් භූමිය පූජනීය දළදා මාලිගාව සහිත සතර මහාදේවාල පෙනෙන තෙක් මානයේ රජමාලිගය සහ නගරයට සමීපව පිහිටි රාජකීය පුෂ්පොද්‍යානයයි. විශේෂයෙන් මෙම කටයුත්තේදී කෘතහස්ත යතිවරුන්ගෙන් සැදුම්ලත් පෝයමළු විහාරයේ සංඝයාගේ දායකත්වය වෙසෙසින් ලැබුණු බව පෙනේ.

---

41. ධම්මානන්ද හිමි (1969), 102 පිටුව



ස්‍යාමොපසම්පදාව මස්තකප්‍රාප්ත කරගැනීමෙහිලා අස්ගිරි මහාවිහාරයේ සංඝයාගෙන් ද පැහැදිලි දායකත්වයක් ලැබී තිබේ. උපසම්පදාව පතා ස්‍යාම දේශයේ පරමධාර්මික රජතුමා වෙත යවන ලද රාජ සන්දේශය අස්ගිරි මහාවිහාරයේ ගණනායක ගොලහැන්වත්තේ ධම්මදස්සි නාහිමියන් විසින් සම්පාදනය කරදීමෙන් ඒ බව මැනවින් පැහැදිලි වේ.[42]

මේ අනුව ස්‍යාමොපසම්පදාව මල්වතු අස්ගිරි දෙපාර්ශ්වයේම ඓතිහාසික ජයග්‍රහණයක් පමණක් නොව කල්යත්ම ලක්දිව ඇති

---

[42]. මංගල හිමි, ගොඩගම (2019), ***අස්ගිරි මහාවිහාරය හා තදනුබද්ධ ලේඛන***, චන්ද්‍රානන්ද බෞද්ධ පර්යේෂණ ආයතනය, මහනුවර, 24 පිටුව

වූ දේශපාලන ව්‍යාකූලතා සලකා බලන විට මෙරට බුදුසසුනේ චිරස්ථිතිය වෙනුවෙන් තත්කාල සංඝයා සහ රජතුමා ගත් තීරණාත්මක හා තිරසාර ව්‍යායාමක් වශයෙන් සැලකිය හැකිය.

මෙකී අත්‍යුදාර ශාසනික පුනරුදයේ කේන්ද්‍රස්ථානය මල්වතු මහාවිහාරයයි. පාර්ශ්වීය භේදයකින් තොරව පෝයමළු අස්ගිරි දෙපාර්ශ්වීය සංඝයා පුෂ්පාරාම විහාරය වටා කේන්ද්‍රගත වන්නේ තත්කාල ශාසනානුශාසක මෙන්ම රාජ්‍ය අනුග්‍රහය ලබාගනිමින් පුනරුදයේ නායකත්වය ඉසිලූ වැලිවිට සරණංකර සංඝරාජ මාහිමියන් පුෂ්පාරාම විහාරය ස්වකීය නිත්‍ය වාසස්ථානය කරගැනීම හේතුවෙනි. එපමණක් නොව උන්වහන්සේගේ ශිෂ්‍යභාවය ලබා පුෂ්පාරාම විහාරයේ වැඩසිටි තිබ්බටුවාවේ බුද්ධරක්ෂිත, දරමිටිපොල ධර්මරක්ෂිත, ගිනිගත්පිටියේ සංඝරක්ෂිත, රඹුක්වැල්ලේ ධර්මරක්ෂිත සහ මොරතොට ධම්මක්ඛන්ධ ආදී ප්‍රතිබල සම්පන්න යතිවරයන් වහන්සේලාගෙන් එය ප්‍රභාවත් වූ බැවිනි. එපමණක් නොව වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ ශිෂ්‍යවර සිටිනාමළුවේ ධම්මජෝති හිමි වෙතින් දක්ෂිණ ලංකාවේ විශාල සඟ පරපුරක් විහිදී තිබේ. වේහැල්ලේ ධම්මදින්න, කඳුරුපොකුණේ ධම්මජෝති, දික්වැල්ලේ බුද්ධරක්ඛිත වැනි යතිවරු එහි ප්‍රදීපස්ථම්භ වේ. ඒ අතර වේහැල්ලේ ධම්මදින්න හිමියන්ගේ ශිෂ්‍යවරයන් ලෙස කටයුතු කළ රන්සෑගොඩ ධම්මදස්සි, කඹුරුපිටියේ ගුණරතන, කඳුරුපොකුණේ ස්වර්ණජෝති යන යතිවරුන් මගින් එය තවදුරටත් ව්‍යාප්ත වූ අතර වටරග්ගොඩ ධම්මපාල, බෝවල ධම්මානන්ද යන යතිවරුන් මගින් මුල්කිරිගල සඟ පරපුරට

සම්බන්ධ වේ.[43] තවද වැලිවිට සරණංකර සඟරජ මාහිමියන්ගේ ශිෂ්‍යභාවයට පත් වෙල්ලස්සේ කොකුන්නෑවේ සංඝකීර්ති හිමියන් හා උන්වහන්සේගේ ශිෂ්‍ය බණ්ඩිගොඩේ නිග්‍රෝධ හිමියන් වෙතින් පොතුබන්දන, කොටසරපියන්ගලු, කලබුළුලන්ද, දඹවින්න, බෝගොඩ හා මුප්පනේ ඇතුළුව ඌවේ විශාල සඟ පරපුරක් විහිදී තිබේ.[44] අස්ගිරි මහාවිහාරයෙන් ද එබඳු යතිවර පිරිසක් පහළ වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

කෙසේ වෙතත් මේ සියලුදෙනා වහන්සේම මුලදී පුෂ්පාරාම විහාරයේ මංගල උපොසථාගාරයෙන් උපසම්පදාව ලැබූ අතර දෙපාර්ශ්වයේම සංඝයා විසින් සාමග්‍රියෙන් ඒකරාශීව 'කීර්ති ශ්‍රී රාජසිංහ කතිකාවත' සම්පාදනය කරන ලද්දේ ද පුෂ්පාරාම මහාවිහාරයේදී ය.[45] රජතුමාගේ නියමයෙන් උභයවාසයේ සංඝයා අටුවා ටීකා සහිතව විනය පිටකය සාකච්ඡා කරන ලද්දේ ද පුෂ්පාරාම මහාවිහාරයට ඒකරාශීව ය.[46]

## ස්‍යාමොපසම්පදාව සහ පුෂ්පාරාම සීමාව සම්මත කිරීම

මල්වතු මහාවිහාරයේ සීමාමාලකය සම්මත කිරීම පිළිබඳ ප්‍රවෘත්තිය මැනවින් වාර්තා කර ඇති මූලාශ්‍රය වනුයේ ***ස්‍යාමොපසම්පදාවතයි.*** ඊට හේතුව එය සමකාලීනව රචනා වූ

---

43. ***මල්වතු මහාවිහාර වංශය*** (1989), 26 පිටුව

44. ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1966), ***ඌව ඉතිහාසය***, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 30 පිටුව

45. සුරවීර, ඒ.වී. (2005), ***කතිකාවත් හා භික්ෂු සමාජය***, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 154 පිටුව

46. ***සිංහල විමාන වස්තු ප්‍රකරණය*** (2003), ධම්මානන්ද හිමි, මාකෙහෙල්වල (සංස්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල, 246-247 පිටු; ***කොළඹුන්නේ මුදියන්සේගේ රාජාවලිය*** පුස්කොළපොත (අමුද්‍රිත)

කෘතියක් මෙන්ම අදාළ සිදුවීම්වලට අත්‍යන්තයෙන්ම සම්බන්ධ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මාහිමියන් විසින් සම්පාදනය කරනු ලැබ තිබීමයි. අනෙත් අතට එය කෘතහස්ත ලේඛනයක් වන්නේ ඓතිහාසික තොරතුරු සංග්‍රහ කිරීමේ ප්‍රවීණ යතිවරයාණ කෙනෙක් එය රචනාකොට තිබීමයි. එසේ හෙයින් උන්වහන්සේගේ වාර්තාව මෙහිදී පාදක කරගැනීම වඩාත් යෝග්‍ය සේ පෙනේ;

...එකල්හි කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමා පෙරගමන් කොට ප්‍රවර උපාලි තෙරුන් වහන්සේ ප්‍රධාන ස්‍යාම තෙරුන් වහන්සේලා දැක ගෞරවාදරයෙන් නමස්කාර කොට වැඩමවාගෙනවුත් **මල්වතු මහාවිහාරයෙහි** අභිනව කරවන ලද ආවාසය පිළිගන්වා උපන් ප්‍රීති ප්‍රමෝදයෙන් චක්‍රරත්නය ලද්දාක් මෙන් පින පිනා උපස්ථාන කොට... එම ශ්‍රී මුඛාභිධාන සංවත්සරයෙහි කටක රවි දෙභාග වූ තුදුස්වක් නම් තිථිය ලත් කිවිදින උපාලි ස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍ය සාමණේර නමක් උපසම්පදා කිරීම සඳහා විභාග කොට පරීක්ෂා කර බලා සියලුම සංඝකර්ම කිරීමට අනුදැන වදාළා වූ බද්ධාබද්ධ සංඛ්‍යාත දෙවැදෑරුම් සීමා අතුරෙන් ආබද්ධ සීමොපතව ග්‍රාමසීමාවට ඇතුළත් වූ ධර්මශාලාවෙහි එම සාමණේර නම පළමුකොට උපසම්පදා කළ සේක.

අනතුරුව කටක රවි තුන්භාග වූ ඇසළ පුර පසළොස්වක් ලත් ශනිදින පෙරයම් රාත්‍රියෙහි නෛක ශ්‍රී විරාජමාන වූ ලංකේශ්වර කීර්ති ශ්‍රී රාජසිංහ මහරජතුමා මහත් වූ කරුණාධ්‍යාසයෙන් ස්වකීය

පාදයෙන් පෙරකී ධර්මශාලාවට ප්‍රවිෂ්ටව උපාලි ස්ථවිරයන් වහන්සේ ප්‍රධාන කොට අටළොස් මහාස්ථවිරයන් වහන්සේලා ඇතුළුව නවක භික්ෂූන් වහන්සේලාත් එම ධර්මශාලාවට වැඩමවන ලදුව... වැඳ ආරාධනා කොට උපොසථාරාම විහාර නායක පදප්‍රාප්ත කොබ්බෑකඩුවේ උන්නාන්සේ ද වැලිවිට සරණංකර උන්නාන්සේ ද හුලංගමුවේ උන්නාන්සේ ද බඹරදෙණියේ උන්නාන්සේ ද තිබ්බටුවාවේ උන්නාන්සේ ද අස්ගිරි විහාරයේ නායක පදප්‍රාප්ත නාවින්නේ උන්නාන්සේගේ ද එදවස්හි උපසම්පදා මංගල්‍යය සිද්ධ කළාහු ය...

ඉක්බිති ඒ ධර්මශාලායෙහි වැඩහුන් සියළු භික්ෂූහු පූර්ව කරණ පූර්වකෘත්‍යාදිය නිමකොට ඒ ගිම්හාන ඍතුයෙහි අටවැනි වූ පොහොය නිම වූ කල්හි ද්වීප චක්‍රවර්තී ස්වාමී වූ කීර්ති ශ්‍රී රාජසිංහ මහරජාණන් විසින් වස් වැසීම පිණිස කරන ලද ආරාධනය පිළිගෙන එම කටක රවි සතරභාග වූ අවපෑළවිය ලත් රිවිදින පෙරවස් එළඹ වදාළ සේක. එකල්හි කීර්ති ශ්‍රී රාජසිංහ මහරජාණන් බොහෝ කුසල සම්භාරයන් රැස්කිරීමට යෙදී බද්ධසීමාවට සිද්ධ කරවමියි යන උදාරතරාධ්‍යාසයෙන් පාෂාණ නිමිති ශෛල ස්ථම්භාදිය මහෝත්සාහයෙන් සම්පාදනය කොට පෙර විමලධර්මසූරිය මහරජාණන් විසින් සාදවන ලද ධර්මශාලාව දිරාපත් වූ හෙයින් ද එහි උපොසථාගාරය කරනු කැමති හෙයින් ද ඒ ධර්මශාලාවෙහි ඡදන බන්ධනාදිය වඩවාපියා ඒ

භූමිමාලකයට සුවසේ වැඳ නික්මීම පිණිස බැඳ තිබූ දොරටුවෙහි පියගැටපහණ සතර පෙළින් දකුණු දොරටුවෙහි පියගැටපෙළ තබා පශ්චිමෝත්තර පූර්ව සංඛ්‍යාත තුන්දොරටුවෙහි පියගැට පහකොට ධර්මශාලා භූමිමාලකය මැදිකොට දිගින් සමපනස් රියනක් හා පළලින් සූවිසි රියන් භූමිප්‍රදේශයෙහි අටකොණ පාෂාණ නිමිති පිහිටුවා ඒ පාෂාණ නිමිති මැදිකොට සතර දෙසින් එකෙකි රියන ගත් කල්හි දිග දෙපණස් රියන් පුළුල් සවිසිරියන් භූමිප්‍රදේශය මඤ්ච ප්‍රමාණ සතිසකට නොහොත් සතිස් මැඩිල්ලකට බෙදා ඉක්බිති ගම්භීර ධීර වීර වික්‍රම ප්‍රතාපාලංකෘත ශ්‍රී ලංකේශ්වර වූ කීර්ති ශ්‍රී මහාරාජෝත්තමයාණන් **මල්වතු මහාවිහාරයට** පැමිණ අයෝධ්‍යාපුරාධීශ්වර වූ ධාර්මික මහාරාජෝපනීය ස්වර්ණ පුස්තකය පෙරටුකොට ඇති උපාලි මහතෙරුන් වහන්සේ ද ආර්යමුනි මහතෙරුන් වහන්සේ ද මහානාම මහතෙරුන් වහන්සේ ද බ්‍රහ්මජෝති මහතෙරුන් වහන්සේ ද මහාපුඤ්ඤ තෙරුන් වහන්සේ ද චන්දසාර තෙරුන් වහන්සේ ද සාරචන්ද්‍ර තෙරුන් වහන්සේ ද මණිජෝති තෙරුන් වහන්සේ ද චන්දජොති තෙරුන් වහන්සේ ද ඉන්ද සුවණ්ණ තෙරුන් වහන්සේ ද බ්‍රහ්මසාර තෙරුන් වහන්සේ ද යසදින්න තෙරුන් වහන්සේ ද මහාසුවණ්ණ තෙරුන් වහන්සේ ද ධම්මජෝති තෙරුන් වහන්සේ ද මහාමණිසාර තෙරුන් වහන්සේ ද මහාමුනි තෙරුන් වහන්සේ ද පුඤ්ඤජාත තෙරුන් වහන්සේ ද ඉන්දජොති තෙරුන් වහන්සේ ද යන අටළොස්


මහාතෙරුන් වහන්සේලා ප්‍රධාන කොට ඇති උපාලි ශිෂ්‍යභූත භික්ෂූන් වහන්සේ ද උපෝෂිතාරාම නායක පදවි ප්‍රාප්ත කොබ්බෑකඩුවේ භික්ෂූන් වහන්සේ ද වැලිවිට සරණංකරාභිධාන භික්ෂූන් වහන්සේ ද හුලංගමුවේ භික්ෂූන් වහන්සේ ද බඹරදෙණියේ භික්ෂූන් වහන්සේ ද තිබ්බටුවාවේ භික්ෂූන් වහන්සේ ද අස්ගිරි විහාරේ නායකපද ප්‍රාප්ත නාවින්නේ භික්ෂූන් වහන්සේ ද යන නවක භික්ෂූන් වහන්සේලා හත්නම ඇතුළුව අතිරේක විංශද් වර්ගික මහාසංඝයා කෙරෙහි මහත් ගෞරව පවත්වා... සීමාමාලකය තුන් යලක් ප්‍රදක්ෂිණා කොට දකුණුදිග පියගැට පන්තියෙන් මාලක උඩට වැඩම වූ සඳ නැගෙනහිර බලා උත්තරානුදිසායෙහි පාෂාණ නිමිත්ත මැදිකොට නවක භික්ෂූන් බස්වා අත්පස නොවිහිද රන්පොත බලමින් දෙවැදෑරුම් වූ සමූහන කර්ම වාක්‍ය කර්මවාගාචාර්යන් ලවා කියවා අනතුරුව ප්‍රදක්ෂිණාවර්ත වශයෙන් දෙවෙනි තුන්වැනි හතරවැනි මැඩිල්ල දක්වා ද එසේම වාමාර්ත වශයෙන් වැඩිලි සතරෙක්හි ද යනාදී පිළිවෙලින් සතිස් මැඩිල්ලෙහි සතිස් වරක් සමූහන කර්ම වාක්‍ය කියවා ඉක්බිති උපාලි ස්ථවිර ප්‍රමුඛ මහාසංඝයා වහන්සේ පූර්වදිග පාෂාණ නිමිත්ත කරා පැමිණ වැඩසිටි කල්හි ඒ පාෂාණ නිමිත්ත සමීපයට බාහිර පාර්ශ්වයෙන් අනුසම්පන්න නමක් පැමිණ දොහොත් මුදුන් තබා උක්කුටුකයෙන් උන් කල්හි ඇතුළුපසෙහි හුන් උපාලි ස්ථවිරයන් විසින් "පුරත්ථිමාය දිසාය කිං නිමිත්තං"යි විචාළ කල්හි ඇදිලි බැද වැඩසිටි නම විසින් "පාසාණෙ

> නිමිත්තං" යන මේ පදය කියා දක්ෂිණාවර්ත වශයෙන් "පුරත්ථිමාය අනුදිසාය දක්ඛිණාය අනුදිසාය" යනාදී ක්‍රමයෙන් උත්තරානුදිශාව දක්වා ද නිමිති කීර්තනය කොට නිම වූ කල්හි හැමදෙනා වහන්සේම සීමාමාලකය මැදට පැමිණ අත්පස නොවිහිද පළමු පරිද්දෙන් රන්පොත බලාගෙන සම්මත කර්මවාක්‍යය නොහොත් බද්ධකර්ම වාක්‍යය නොහොත් බද්ධකර්ම වාක්‍ය දෙක සමාප්ත කළ කල්හි ඒ ඇසූ ලංකේශ්වර ප්‍රමුඛ රාජරාජ මහාමාත්‍යාදීන් ඇතුළුව දහස් ගණන් සේනාව අහස පොළෝ දෙක ගුගුරන්නාක් මෙන් එකපැහැර සාධුකාර දුන්හ....[47]

මෙලෙස බද්ධසීමාව ප්‍රතිෂ්ඨාපනය කිරීමෙන් අනතුරුව ඒ මත උපොසථාගාරය කරවා තිබේ. '...මහොත්සාහයෙන් ගෙන්වන ලද ගල්ටැම් පිහිටුවා දැවදඬු ගොණැස් පේකඩ ආදිය කිරීමෙහි දක්ෂ වඩුවන් ලවා විශ්වකර්ම නිර්මිතයක් මෙන් ද්වාරාබාහ සහිත ඉෂ්ටකාච්ඡාදනමය උපොසථාගාරය කරවා...' නිමකළ බව ***ස්‍යාමොපසම්පදාවතේ*** සඳහන් වේ. යථොක්ත වාර්තාව ඓතිහාසික වශයෙන් අතිශය වැදගත් වනුයේ අදාළ ඓතිහාසික කාර්යය සඳහා සෘජුවම මැදිහත් වූ මහතෙර නමක් ඉතිහාස සංඥාවෙන් යුතුව එය තත්සමයේදීම ලේඛනගත කොට ඇති හෙයිනි.

---

[47]. ***ස්‍යාමොපසම්පදාවත*** (2013), 49-52 පිටු



වර්ෂ 1870 දශකයේ උපසම්පදා විනය කර්මය පැවැත් වූ
ආකාරය දැක්වෙන සිතුවමක්

පුෂ්පාරාම විහාරයේ බද්ධසීමාව ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දේ ප්‍රවර උපාලි මහතෙරුන් වහන්සේ ප්‍රධාන ස්‍යාම තෙරුන් වහන්සේලාගේ ද, පෝයමළු සහ අස්ගිරි උභය මහාවිහාරීය සංඝයාගේ ද යන සියලුදෙනා වහන්සේගේම සහභාගිත්වයෙන් වීම සැලකිය යුතු කරුණකි. එසේ නම් මෙය ලක්දිව බුදුසසුන ප්‍රතිෂ්ඨාපනයේදී පිහිටුවන ලද ප්‍රථම බද්ධසීමාව සේම අතිශය සම්භාවනීය ය. මක්නිසා ද යත් අන්තයට පිරිහී තිබූ සඟසසුන යළි පුනර්ජීවනය ලබන්නේ පුෂ්පාරාම උපොසථාගාරයෙන් වන හෙයිනි. ඉක්බිතිව උභය මහාවිහාරීය සංඝයා රැස්ව අස්ගිරි මහාවිහාරයේ ගෙඩිගේ බද්ධසීමාව ප්‍රතිෂ්ඨාපනය කෙරෙන

අතර,[48] ප්‍රවර උපාලි මහතෙරුන් වහන්සේගේ මූලිකත්වයෙන් පසුව පිටිසරබද විහාර විසිහතරක පමණ පොහොයසීමා සම්මත කළ බව පෙනේ.

වර්ෂ 1753 ඇසළ පුර පසළොස්වකදා මල්වතු මහාවිහාරයේ මංගල උපොසථාගාරයේදී සිදු කරන ලද ස්‍යාමොපසම්පදාවෙන් අනතුරුව කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා මෙරට පෞරාණික සංඝ සංවිධානය නැවත ස්ථාපිත කරමින් දෙවෙහෙරටම අධිපති සඟරජ පදවියත්, ග්‍රාමවාසයට අයත් මහතෙර පදවිය සහ අරඤ්ඤවාසයට අයත් මහතෙර පදවිය පත්කරන්නට යෙදුණි. ඒ අනුව මල්වතු මහාවිහාර පාර්ශ්වයේ ප්‍රථම මහපදවිය සහිත උපසංඝරාජ ධුරය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මාහිමියන් වෙත පත්විය.[49] අනතුරුව අනුනායක, කාරක පදවි හා ප්‍රාදේශීය නායක පදවි පත්කොට තිබේ.

ස්‍යාමොපසම්පදාවෙන් අනතුරුව මෙරටට එල්ල වූ බටහිර ආක්‍රමණ හමුවේ මල්වතු මහාවිහාරය විචක්ෂණශීලීව කටයුතු කර තිබේ. සිංහල රාජධානිය බිඳ වැටුණ ද, ආගන්තුක ඉංග්‍රීසි ආණ්ඩුවේ සහය ලැබ හෝ දංෂ්ට්‍රාධාතු සංරක්ෂණයත්, ශාසනික කටයුතු කඩ නොකොට පැවැත්වීමත් ඒ යටතේ සිදු කර තිබේ. ඒ අනුව උඩරට ගිවිසුම තුළ බුද්ධ ශාසනයේ චිරපැවැත්ම සහතික කරගැනීමට මල්වතු මහාවිහාරය සක්‍රීයව ක්‍රියා කළ අතර ආණ්ඩුව

---

48. මංගල හිමි (2019), 92 පිටුව

49. ***මන්දාරම්පුර පුවත*** (1958), 710-723 කවි

සමග මිත්‍රශීලීව හා ස්වෛරීව ක්‍රියාකළ අයුරු ඉංග්‍රීසීන්ගේ ද සාකච්ඡාවට ලක්ව තිබෙන බවට තොරතුරු හමු වේ.[50]


උඩරට ගිවිසුමට අනුව වර්ෂ 1847 වනතුරු ශාසනික කටයුතු විෂයෙහි ඉංග්‍රීසි ආණ්ඩුව ඍජුවම මැදිහත් විය.[51] අනතුරුව ශාසනික කටයුතු පිළිබඳ බලය උභය මහාවිහාර වෙත පවරාදීමෙන් පසුව මල්වතු මහාවිහාරය ඓතිහාසිකව සහ නිත්‍යානුකූලව ලද බලය කරණකොටගෙන කතිකාවත් සම්පාදනය කිරීමත්, ශාසනික පදවි පත් කිරීමත් සිදුකොට තිබේ. වර්තමානය දක්වා මල්වතු මහනාහිමියන් ප්‍රමුඛ සානුනායක ගරුතර කාරක මහාසංඝ සභාව යථෝක්ත ඓතිහාසික මෙහෙවරෙහි කාලානුරූපීව නිමග්නව සිටී.

[50]. ***Diary of Mr. John D'Oyly*** (1917), Colombo Apothecaries Co. Ltd., Colombo, pp. 230-231, 238-240

[51]. සෝමරත්න, ජී.පී.වී. (2015), ***ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 219 පිටුව



ප්‍රථම මල්වතු මහපදවිය
වෙනුවෙන්
තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ
බුද්ධරක්ෂිත මාහිමියන් වෙත
පිදූ වටහපත



## මල්වතු මහාවිහාර පාර්ශ්වයේ මහපදවිය හොබවන ලද මාහිමිපාණන් වහන්සේලා

1. අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත මහනාහිමි 1753-1773
2. අතිගෞරවාර්හ මැදවල ශ්‍රී ආනන්ද මහනාහිමි 1773-1774
3. අතිගෞරවාර්හ දරමිටිපොල ශ්‍රී ධර්මරක්ෂිත මහනාහිමි 1774-1787
4. අතිගෞරවාර්හ මොරතොට රාජගුරු ශ්‍රී ධම්මක්ඛන්ධ මහනාහිමි 1787-1811
5. අතිගෞරවාර්හ කොබ්බෑකඩුවේ රාජගුරු ශ්‍රීනිවාස මහනාහිමි 1811-1819
6. අතිගෞරවාර්හ වැලිවිට ශ්‍රී සරණංකර මහනාහිමි 1819-1822
7. අතිගෞරවාර්හ ගම්මුල්ලේ ශ්‍රී සුමන මහනාහිමි 1822-1825
8. අතිගෞරවාර්හ කොටිකාපොල ශ්‍රී සෝභිත මහනාහිමි 1825-1826

9. අතිගෞරවාර්හ කන්දේගෙදර ශ්‍රී සරණංකර රේවත මහනාහිමි 1826-1829

10. අතිගෞරවාර්හ ගල්ගිරියාවේ ශ්‍රී ධර්මරක්ෂිත සුමංගල මහනාහිමි 1829-1850

11. අතිගෞරවාර්හ පරකුම්බුරේ ශ්‍රී සරණංකර විපස්සි මහනාහිමි 1850-1862

12. අතිගෞරවාර්හ මැදගම ශ්‍රී ධර්මරක්ෂිත දේවමිත්ත මහනාහිමි 1862-1877

13. අතිගෞරවාර්හ හිප්පොල ශ්‍රී ධර්මරක්ෂිත සෝභිත මහනාහිමි 1877-1893

14. අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමි 1893-1913

15. අතිගෞරවාර්හ ගල්ගිරියාවේ ශ්‍රී ධර්මරක්ෂිත බුද්ධරක්ෂිත මහනාහිමි 1913-1919

16. අතිගෞරවාර්හ අමුණුගම රාජගුරු ශ්‍රීනිවාස පියදස්සි මහනාහිමි 1919-1924

17. අතිගෞරවාර්හ අඹන්වැල්ලේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමි 1924-1927

18. අතිගෞරවාර්හ පහමුණේ ශ්‍රී ධර්මකීර්ති සරණංකර සුමංගල මහනාහිමි 1927-1945

19. අතිගෞරවාර්හ රඹුක්වැල්ලේ ධර්මකීර්ති ශ්‍රී ධර්මරක්ෂිත සෝභිත මහනාහිමි 1946-1955

20. අතිගෞරවාර්හ වැලිවිට ධර්මකීර්ති ශ්‍රී සරණංකර මහනාහිමි 1955-1956

21. අතිගෞරවාර්හ පුරිජ්ජල ශ්‍රී සිද්ධාර්ථ සරණංකර මහනාහිමි 1956-1963

22. අතිගෞරවාර්හ අමුණුගම රාජගුරු ශ්‍රීනිවාස විපස්සි මහනාහිමි 1964-1969

23. අතිගෞරවාර්හ මඩුගල්ලේ ශ්‍රී සුමන සිද්ධාර්ථ ධම්මසිද්ධි මහනාහිමි 1969-1973

24. අතිගෞරවාර්හ විමලකීර්ති ශ්‍රී සුමන පණ්ඩිත සිරිමල්වත්තේ ආනන්ද මහනාහිමි 1973-1989

25. අතිගෞරවාර්හ රඹුක්වැල්ලේ ශ්‍රී ධර්මරක්ෂිත විපස්සි මහනාහිමි 1989-2004

26. අතිගෞරවාර්හ තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනාහිමි 2004 සිට වර්තමානය දක්වා

# ආශ්‍රිත මූලාශ්‍රය

***ඌනපූරණ සහිතො මහාවංසො*** (1959), බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

***කොළමුන්නේ මුදියන්සේගේ රාජාවලිය*** පුස්කොළ පොත (අමුද්‍රිත)

***නිකාය සංග්‍රහය*** (2001), නානායක්කාර, ගුණවර්ධන (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

***පූජාවලිය*** (2009), ඤාණවිමල හිමි, කිරිඇල්ලේ (සංස්.), ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

**පල්කුඹුර සන්නස** (අමුද්‍රිත)

***මන්දාරම්පුර පුවත*** (1958), ලංකානන්ද හිමි, ලබුගම, (සංස්.), සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

***මල්වතු රාජාවලිය*** පුස්කොළ පොත (අමුද්‍රිත)

***මහාවංසය*** ද්විතීය භාගය (2015), සුමංගල හිමි, හික්කඩුවේ සහ බටුවන්තුඩාවේ, දොන් අන්ද්‍රියස් ද සිල්වා (පරි.), ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, කොළඹ.

***රාජරත්නාකරය*** (1995), රූපසිංහ, කරුණාදාස (සංස්.), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

***සද්ධර්මරත්නාකරය*** (1955), දේවානන්ද හිමි, ධර්මකීර්ති ශ්‍රී සුගුණසාර (සංස්.), රත්නාකර ප්‍රකාශන, කොළඹ.

***සද්ධර්මාලංකාරය*** (1996), ශ්‍රී ලංකා ප්‍රාචීන භාෂෝපකාර සමාගමේ සංස්කරණය, කොළඹ.

***ස්‍යාමොපසම්පදාවත*** (2013), මේධංකර හිමි, තිබ්බටුවාවේ (සංස්.), කර්තෘ ප්‍රකාශන, මහනුවර.

***සංඝරාජ සාධු චරියාව*** (1997), විමලවංස හිමි, අකුරටියේ සහ සෙනෙවිරත්න, නාගොඩ ආරියදාස, සමයවර්ධන ප්‍රකාශකයෝ, කොළඹ.

***සිංහල විමාන වස්තු ප්‍රකරණය*** (2003), ධම්මානන්ද හිමි, මාකෙහෙල්වල (සංස්.), බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

***සුළුරාජාවලිය*** (1914), විද්‍යාලෝක මුද්‍රණාලය, බුත්ගමුව

ධම්මරක්ඛිත හිමි, කුළුගම්මන (2004), ‘සෙංකඩගලපුර උපොසථාරාමය හා එහි ඓතිහාසික පසුබිම’, ***මල්වතු මහා විහාරය සහ මහ පදවිය***, විමලබුද්ධි හිමි, වල්ගොව්වාගොඩ, විජිතසිරි හිමි, නියංගොඩ, ධම්මරක්ඛිත හිමි, කුළුගම්මන, පියදස්සි හිමි, නැහිණිවෙල සහ සෙනෙවිරත්න, අනුරාධ (සංස්.), මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

ධම්මවිසුද්ධි හිමි, යටදොළවත්තේ (1995), **පොළොන්නරු හා දඹදෙණි කතිකාවත්,** පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය, කැලණිය.

ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1966), ***ඌව ඉතිහාසය***, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

ධම්මානන්ද හිමි, නාවුල්ලේ (1969), ***මධ්‍යම ලංකා පුරාවෘත්ත***, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

නන්දසිරි හිමි, හේනේපොළ (1978), ***මල්වතු මහාවිහාරයේ ප්‍රභවය, සංවිධානය සහ විකාශනය***, ශාස්ත්‍රපති උපාධි නිබන්ධනය (අමුද්‍රිත).

***මල්වතු මහාවිහාර වංශය*** (1989), විමලබුද්ධි හිමි, වල්ගොව්වාගොඩ, විජිතසිරි හිමි, නියංගොඩ සහ සෙනෙවිරත්න, අනුරාධ (සංස්.), බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

මංගල හිමි, ගොඩගම (2019), ***අස්ගිරි මහාවිහාරය හා තදනුබද්ධ ලේඛන***, චන්ද්‍රානන්ද බෞද්ධ පර්යේෂණ ආයතනය, මහනුවර.

රෝහණදීර, මැන්දිස් (2016), ***ලංකාවේ සංඝ සංවිධානය***, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, දෙහිවල.

සරණංකර හිමි, වැලිවිට (2022), ***ශ්‍රී සද්ධර්මතිලක රජමහා විහාර ඉතිහාසය***, සංඝරාජාරාමය, මල්වතු මහාවිහාරය, මහනුවර.

සුරවීර, ඒ.වී. (2005), ***කතිකාවත් හා භික්ෂු සමාජය***, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

***සූරියගොඩ රජමහ විහාරය*** (2015), බණ්ඩාර, ආර්.ඩබ්. ප්‍රියදර්ශන, ගුණසිංහ, හසිත චාමිකර, මදුසංඛ, ඩබ්.එම්. හිරාන් සහ ප්‍රේමරත්න, ජී. මංජුලා කුමාරි (සංස්.), ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

සෙනෙවිරත්න, අනුරාධ (1989), ***කන්ද උඩරට මහනුවර***, මධ්‍යම සංස්කෘතික අරමුදල, කොළඹ.

සෝමරත්න, ජී.පී.වී. (2015), ***ලංකා ඉතිහාසයේ බ්‍රිතාන්‍ය යුගය***, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ.

හෙට්ටිආරච්චි, ඒ.ඇස්. (1968), ‘මහනුවර රජපරපුර’, ***Journal of Royal Asiatic Society*** Vol. XII New Series, Royal Asiatic Society Colombo Branch, Colombo.

***Diary of Mr. John D’Oyly*** (1917), Colombo Apothecaries Co. Ltd., Colombo.

Paranavitana, S. (1960), 'Lankatilaka Inscriptions,' ***University of Ceylon Review*** 18, nos. 1&2, University of Ceylon, Colombo.



සෙංඛණ්ඩශෛලාභිධාන ශ්‍රීවර්ධනපුර

# මල්වතු මහාවිහාරය



ප්‍රකාශනය :

මල්වතු මහාවිහාරය

මහනුවර

දුරකතන අංකය : 081 222 4066

ISBN : 978-624-5554-07-2

9 786245 554072